# ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාව බහුපාක්ෂික පදනමක් මත ක්‍රියාත්මක වන ජනරජයකි. ජනතා ඡන්දයෙන් තේරී පත්වන ජනාධිපතිනිය 1999 වසරේදී, දෙවන වරටත්, වසර 6 ක නිල කාලයක් සඳහා තේරී පත් වූවාය. ඒ අනුව මන්ත්‍රීවරුන් 225 කින් සමන්විත පාර්ලිමේන්තුව, හවුලේ රාජ්‍ය පාලනයෙහි නිරතව සිටී. ශ්‍රී ලංකාවේ උතුර, නැගෙනහිර යන දෙ පළාත සඳහා දමිළ ජාතිකයන්ට වෙනම රාජ්‍යයක් ඉල්ලා සිටි, ත්‍රස්වාදී සංවිධානයක් වන ඊලාම් කොටි සංවිධානය (එල්.ටී.ටී.ඊ) සමග 1983 සිට 2001 වසර තෙක් ශ්‍රී ලංකා රජය සටනෙහි යෙදුනි. ඒ අතර 2001 වසරේදී රජය හා කොටි සංවිධානය ඒකපාක්ෂිකව සටන් විරාම ප්‍රකාශයට පත් කළහ. ඉන් අනතුරු 2002 පෙබරවාරි මාසයේදී දෙපක්ෂය අතර සටන් විරාම ගිවිසුමක්ද අත්සන් කරන ලදී. නෝර්වේජියානු රජයෙන් සපයන ලද පහසුකම් යටතේ දෙපාර්ශවය සාකච්ඡා වාර හයකට සහභාගී වීමෙන් පසුව, අප්‍රේල් මාසයේදී කොටි සංවිධානය සාකච්ඡා අත්හිටවිය. එහෙත් දෙපක්ෂයම සටන් විරාමය අඛන්ඩව පිළිපැදීමෙහි නියැලි සිටියහ. ඒ අනුව එළඹුණු සාම ක්‍රියාදාමයෙහි ප්‍රතිඵලයක් වශයෙන් රටපුරා පිහිටුවා තිබුනු මාර්ග බාධක, නිරීක්ෂණ කපොලු සංඛ්‍යාව සීඝ්‍රයෙන් අඩුවිය. රට අභ්‍යන්තරයෙහි අවතැන්ව සිටි 341,000 ක් පමණ වු ජනයා උතුරේ සහ නැගෙනහිර පිහිටි ස්වකීය මුල් වාසස්ථාන කරා යලි පැමුනුණ අතර ආරක්ෂක නිළධාරීන්, බලය අනිසි අන්දමින් උපයෝගි කර ගැනීමේ සිද්ධීන් සම්බන්ධව බලධාරීහු පරීක්ෂණ ඇරඹූහ.

නොවැම්බර් මස 04 දා, පොදු පෙරමුණේ නායක ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය, පාර්ලිමේන්තුව තාවකාලිකව අත්හිටවූවාය. සාම ක්‍රියාදාමයට අදාල කාලය තුලදී, ආරක්ෂක තත්වයේ පසුබෑමක් ලෙස ජනාධිපතිනිය අර්ථකථනය කළ හේතුව මත, ආරක්ෂක, අභ්‍යන්තර කටයුතු සහ ජනමාධ්‍ය අමාත්‍යාංශ භාර ඇමතිවරුන් නෙරපා හැර, එම අමාත්‍යාංශ වලට අයත් කාර්යභාරයන් ඇය තමන් යටතට පවරා ගත්තාය. පාර්ලිමේන්තුව 19 දා යලි කැඳවනු ලැබු අතර, යථෝක්ත අමාත්‍යාංශ තුනෙහි පාලනය සහ සාම ක්‍රියාදාමය තුළ අගමැතිවරයා ගේ කාර්යභාරය පිළිබඳව ජනාධිපතිනියගේත් අගමැතිවරයාගේත් නිළධාරීන් අතර වසර අවසානය තෙක්ම සාකච්ඡා පවත්වන්නට යෙදුණි. ඒ අතර ජනාධිපතිනිය සාම ක්‍රියාදාමයට ස්වකීය ඇප කැප වීමේ දැඩි අභිප්‍රාය අවධාරනය කළ නමුදු, වසර අවසාන වන විටත් සාම සාකච්ඡා අත්හිටවනු ලැබ තිබිණි.

සටන් විරාමයට මත්තෙන් පවත්වනු ලැබු 2001 පාර්ලිමේන්තු මැතිවරණය නිදහස් හා සාධරණ එකක් වුවද, එහි අක්‍රමිකතා දක්නට ලැබුණි. එහිදී මරණයට පත්වූවන්ගේ සංඛ්‍යාව අවම වශයෙන් 50 කි. එම මැතිවරණයෙන් පාර්ලිමේන්තුව තුළ බහුතර ආසන සංඛ්‍යාවක් ලැබුනේ එක්සත් ජාතික පක්ෂය විසින් මෙහෙයවන ලද පක්ෂ සන්ධානයක් වු එක්සත් ජාතික පෙරමුණටය. එල්.ටී.ටී.ඊ සාමාජිකයෝ මැතිවරණ සමයේදී රජයේ පාලනයට අයත් ප්‍රදේශ වලට හොරෙන් එතියි, යන බිය හේතුකොට ගෙන, ශ්‍රී ලංකා රජය ගත් තීරණය වුයේ එල්.ටී.ටී.ඊ පාලන ප්‍රදේශ වලින් ඡන්දය පාවිච්චි කිරීම සඳහා බැහැරව යන 40,000 කටද වැඩි ඡන්ද දායකයන් සංඛ්‍යාවකට රජයේ හමුදා වලට, අයත් නිරීක්ෂණ කපොලු පසුකර යාම තහනම් කිරීමය. දෙමළ ඡන්ද දායකයන්ට ස්වකීය ඡන්දය පාවිච්චි කිරීම වලක්වාලීමට තුඩු දුන් එම ක්‍රියා, මානව හිමිකම් උල්ලංඝණය කිරීමක් බව එම වසරේම තීරණය කළ ශ්‍රේෂ්ඨාධිකරණය පුරවැසියන් එසේ ඡන්දය දීමෙන් වලකාලීමේ වරද හේතුකොට ගෙන රජයට දඩයක්ද නියම කළේය. ව්‍යවස්ථාමය ගැටළු, නිරතුරුවම රජය අර්ථකථනය සඳහා යොමු කළේ ස්වාධීන අධිකරණයක් වෙතය.

දෙසැම්බර් 19 දා ජනාධිපතිවරිය විසින් අභ්‍යන්තර ආරක්ෂක අමාත්‍යාංශය වශයෙන් නම් කරනු ලැබූ අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශය 60,000 ක පොලිස් බලඇණියක් පාලනය කරයි. එය කලින් එල්.ටී.ටී.ඊ සංවිධානයට එරෙහිව යුදමය කටයුතු සඳහා යොදා ගනු ලැබූ එසේම පළාත් බහුතරයක අභ්‍යන්තර ආරක්ෂාවට වගකිව යුතු වූද බලඇණියකි. ඉන් පෙරත් පොලිසියේ විශේෂ කාර්‍ය සාධක බලකායද එල්.ටී.ටී.ඊ සංවිධානයට එරෙහිව යුදමය ක්‍රියාවල යෙදුණි. යුද හමුදාවේ 112,000 ක්ද නාවික හමුදාවේ 27,000 ක්ද ගුවන් හමුදාවේ 20,000 ක්ද වන භට සංඛ්‍යාව ආරක්ෂක අමාත්‍යාංශයේ පාලනයට යටත්ය. ඒ අතර ප්‍රාදේශිය මට්ටමෙන් තෝරා ගනු ලැබූ 20,000 කට අධික සංඛ්‍යාවකගෙන් යුත් ග්‍රාමාරක්ෂක බලඇණියක්ද එල්.ටී.ටී.ඊ බල ප්‍රදේශ තුල නිවසන සිංහල සහ මුස්ලිම් ප්‍රජාවට ආරක්ෂාව සපයන අතර ඔවුන් පොලිසියට වගකිව යුතුව ඇත. ආරක්ෂක හමුදාවන්හි විධිමත් පාලනය සිවිල් සමාජයේ බලාධිකාරීන් විසින් කරනු ලැබේ. ආරක්ෂක අංශවල ඇතැම් නිළධාරීන් බරපතල ලෙස මානව හිමිකම් උල්ලංඝනය කර ඇත.

ශ්‍රී ලංකාව ඇඟළුම්, තේ, රබර්, පොල් සහ මැණික් අපනයනය මත පදනම් වු වෙළඳ පොල ආර්ථිකයක් සහිත අඩු ආදායම් ලබන රටකි. විදේශගත සේවයෙහි නියුක්ත වුවන්ගෙන් මෙන්ම, සංචාරක ව්‍යාපාරයෙන්ද තවදුරටත් ශ්‍රී ලංකාව විදේශ විනිමය උපයා ගනී. රටේ මුළු ජනගහනය දසලක්ෂ 19.4 කි. 2002 වසර තුල දළදේශිය නිෂ්පාදන වර්ධනය දළ වශයෙන් 3.2% ක් වු අතර මෙම වසර සඳහා අපේක්ෂිත දළදේශිය නිෂ්පාදනය 5.5% ක් සේ ගනන් බලා තිබේ. සාමය පවත්වා ගැනීමේ ප්‍රතිලාභයක් වශයෙන්, ආරක්ෂක වියදම් අඩුකර ගැනීමටත් රාජ්‍ය අංශයේ ණයගැති බව පාලනය කර ගැනීමටත් අවස්ථාව ලැබී ඇත. අඩු පොලි අනුපාතය, දේශිය ණය ආපසු අය කර ගැනිම, සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධනය, කොටස් වෙළඳ පොළ ප්‍රතිසංවිධානය සහ ඍජු විදේශ අයෝජන ප්‍රමාණයේ වැඩිවීමද, ආර්ථිකයේ පෝෂණයට හේතු සාධක විය. අවසාන මාස 2 ඇතුළත ජනාධිපති සහ අගමැති දෙපොළ අතර දක්නට ලැබුනු සමගාමීව කටයුතු කිරීමේ නොහැකියාවද රටේ ආර්ථිකය කෙරෙහි අනිටු බලපෑම් ඇති කිරීමේ සාධකයක් විය. දේශිය වෙළඳ පොළ සහ ඍජු විදේශ ආයෝජනය කෙරෙහි එය විශේෂයෙන් අනිටු විපාක ඇති කෙළේය.

රජය ස්වකිය රටවැසි ජනතාවගේ මානව හිමිකම් කෙරෙහි සැලකිලිමත් වුවද ඇතැම් ප්‍රදේශවල බලගතු ගැටලු උද්ගත වනු දක්නට ලැබුණි. දේශපාලන අරමුණු සඳහා ආරක්ෂක හමුදා මිනිස් ඝාතන කල බවක් හෝ පැහැරගෙන යාමක් හෝ වාර්තා වී නැත. එහෙත් යුද හමුදාව සහ පොලිසිය විසින් හිංසා කිරීම්, ඝාතන සහ අත්අඩංගුවේ සිටියවුන් දුෂණය කිරීම් ගැන දැනගන්නට ලැබී තිබේ. සිරකඳවුරු වල තත්වය කණගාටුදායකය. වසර ඇතුළත අත්තනොමතික අන්දමින් යම් යම් අයවලුන් අත්අඩංගුවට ගත් බවට වාර්තා ලැබී ඇත. ත්‍රස්තවාදය තුරන් කිරීමේ පනත යටතේ රඳවා ගෙන සිටි, ද්‍රවිඩ ජාතිකයින් 750 කට වැඩි ප්‍රමාණයක් 2002 වසර තුළ රජය විසින් මුදාහරිනු ලැබ ඇත. එම පනත යටතේ අත්අඩංගුවට පත් ද්‍රවිඩ ජාතිකයන් අතුරෙන් තවමත් රඳවාගෙන සිටිනුයේ 65 දෙනකු පමණි. 2001 වසරේදී නිෂ්ප්‍රභා කරන ලද හදිසි නිතිය යටතේ මෙන්ම, ත්‍රස්තවාදය වැලැක්වීමේ නිතිය යටතේද පූර්ව බලපත්‍රයක් (වොරන්ට්) නොමැතිව සිරභාරයට ගැනීමටත් හේතු දැක්වීමකින් තොරව රඳවා තබා ගැනීමටත් අවකාශ සැලසී තිබිණි. ආරක්ෂක නිළධාරීන් විසින් මාධ්‍යකරුවන්ට අතවර, හිරිහැර කිරීම් පිළිබඳ සිද්ධීන් කිහිපයක් වර්ෂය තුල වාර්තා වී ඇත. ඉන් පෙර මෑත අතිතයේ එවැන්නක් සිදුවී නැත. කාන්තා විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියා, ළමා අපයෝජන, ළමා ශ්‍රම

නියුක්තිය, විශේෂයෙන් අපනයන ප්‍රවර්ධන කලාපය තුළ කම්කරු අයිතිවාසිකම් සීමා කිරීම් සහ ආබාධිත පුද්ගලයන්ට එරෙහි ක්‍රියා, යනාදිය පිළිබඳ කොතෙකුත් ප්‍රශ්න උද්ගත විය. සුළු ආගමික කොටස් වලට එරෙහි කෙනහිලිකම් සහ දමිළ ජාතික විරෝධතාද ප්‍රබල ගැටළු විය. කාන්තාවන් සහ ළමයින් බලෙන් වැඩට යෙදවීම සඳහා මෙන්ම වාණිජ මට්ටමෙන් සංවිධාන වු පදනමක් මත ලිංගික අපචාරයෙහි යෙදවීම සඳහාත් වෙළඳ භාණ්ඩ වශයෙන් යොදාගෙන තිබේ. ළමයින් ලිංගික අපයෝජනයෙහි යෙදීමට එරෙහිව ක්‍රියා කළ බැවින් ජාත්‍යන්තර මට්ටමේ ලිංගික අපයෝජන ජාවාරම සැහෙන මට්ටමකට අඩපණ විය.

ඒ අතර එල්.ටී.ටී.ඊ සංවිධානය අතිමහත් අන්දමින් මානව හිමිකම් උල්ලංඝණය නොනවත්වාම කළේය. අත්තනෝමතිකව හා අසාධාරණ අන්දමින් පුද්ගලයන් හිර භාරයට ගැනීම්, වධහිංසා පැමිණවීම්, අඩන්තේට්ටම් කිරීම්, සඟවා තැබීම්, දේපල පැහැර ගැනීම් හා බලෙන් රඳවා ගැනීම් යනාදියට එල්.ටී.ටී.ඊ සංවිධානය වගකිව යුතුව ඇත. එල්.ටී.ටී.ඊ සංවිධානය අඛණ්ඩවම කරගෙන ගිය  බිය ගැන්වීමේ ව්‍යාපාරය, යාපනයේ සහ නැගෙනහිර පළාතේ, ඡන්දයෙන් තේරී පත්වූ ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය ආයතන වල කටයුතු අඩාල කිරීමට සමත් විය. ඇතැම් විට උතුරේ සහ නැගෙනහිර දෙ පළාතේ දේශපාලන ක්‍රියාකාරකම් සහ රජයේ කටයුතුද ඔවුන් විසින් වලක්වාලන ලදී. අදාල වර්ෂය ඇතුලත පමණක්, එල්.ටී,ටී.ඊ සංවිධානය විසින්, තම සංවිධානයට පක්ෂපාත නොවූ දේශපාලන සංවිධානවල සමාජිකයන් මෙන්ම, ඔත්තු සපයන්නන් 36 දෙනෙකුට වඩා ඝාතනය කළ බවට බෙහෙවින් සාක්‍ෂි ලැබී ඇත. එල්.ටී.ටී.ඊ සංවිධානය විසින් නැගෙනහිර ප්‍රදේශවාසී මුස්ලිම් ජාතිකයන් බියගැන්වූ අවස්ථා බොහෝය. එම ප්‍රදේශය තුල එල්.ටී.ටී.ඊ සාමාජිකයන්, මුස්ලිම් ජාතිකයන් හා ගැටීම හේතු කොට ගෙන මුස්ලිම්වරුන් ජීවිතක්‍ෂයට පත්වී ඇති අවස්ථා එමටය. උතුරේ සහ නැගෙනහිර විශාල භූමි ප්‍රමාණයක් එල්.ටී.ටී.ඊ පාලනයට යටත් කරගන තිබේ. ඔවුන්ගේ පාලනයට යටත් ප්‍රදේශ අතුරෙන්, කිහිපයකට පමණක් ඇතුල්වීමට, ඔවුන් මාධ්‍යවේදීන්ට අවකාශ සැලසු අවස්ථා තිබේ. එල්.ටී.ටී.ඊ සංවිධානය මගින් පැනවූ ඇතැම් නීති රීති හේතුකොට ගෙන පුරවැසියන්ගේ ගමනාගමනයට තිබුණු නිදහස සීමාවී ඇත. තම අණසක පවතින ප්‍රදේශ තුළ ජීවත්වන ජනතාවට ආණ්ඩු බලය වෙනස් කිරීමේ මානව අයිතිය ඔවුන් උදුරාගෙන ඇත. සාධාරණ නඩු තීන්දුවක් ලබා ගැනීමේ අයිතිය ප්‍රතික්ෂේප කර තිබේ. පෞද්ගලිකත්වය පිළිබඳ අයිතියට ඉඩදී නැත. බාල වයසේ ළමයින් යුද හමුදාවේ සේවයට බඳවා ගෙන තිබේ. සුළු ආගමික, සුළු වාර්ගික ප්‍රජා කොටස්වලට කෙනහිලිකම් කර ඇත.

## මානව හිමිකම් උදෙසා ගෞරවය

### 1 කොටස

### නීති විරෝධීව අත්තනෝමතික අන්දමින් ජීවිතය නැති කිරීමට විරුද්ධ වීමේ නිදහසද ඇතුළත්

**ඒ. පුද්ගලයා සතු ස්වියත්ව කෙරෙහි දක්වන ගෞරවය.**

දේශපාලන හේතුන් මත කරනලද මිනිස් ඝාතන වාර්තා වී නැත. පොලිසිය බාරයේ සිටියදී පුද්ගලයන් හය දෙනකු මරණයට පත් වී ඇති අතර ඉන් දෙදෙනකු මිය යාමට හේතු වී ඇත්තේ පොලිස් පහරදීම් නිසා

බැව් මානව හිමිකම් කොමිසම වාර්තා කරයි. ජුලි මස 24 දා මොරගහහේන පොලිසිය මගින් අත්අඩංගුවට ගනු ලැබූ සුනිල් හේමචන්ද්‍ර නැමැත්තා කොළඹ ජාතික රෝහලට ඇතුළත් කරනු ලැබ මියගියේ පොලිස් පහර දීමකින් බව කියනු ලැබේ. නිට්ටඹුව පොලිසියේදී කරන ලද පහරදීමකින් අනතුරුව එස්. එල්. කුලතුංග නැමැත්තා නොවැම්බර් මස 10 දා කොළඹ ජාතික රෝහලේදී මිය ගියේය. පොලිස් අත්අඩංගුවේ පසුවන අතරතුර මියගිය තවත් සිව් දෙනකු පිළිබඳව මානව හිමිකම් කොමිසම වාර්තා කර ඇතත් ඒ හැම මිය යාමක්ම පොලිස් පීඩන නිසා විය නොහැකිය. ඉලන්දාරි පේඩිගේ විජේරත්න නැමැති අය මැයි මස 13 දා පොලිස් අත්අඩංගුවට ගැනීමේදී අසනීපවී සිටි බවත්, පසුව වැලිවේරිය පොලිසිය ඔහු ගම්පහ රෝහලට ඇතුළත් කිරීමෙන් පසුව මියගිය බවත්, දැන ගන්නට ලැබේ. කොස්ගම පොලිසිය විසින් අගෝස්තු 12 දා සිරභාරයට ගෙන පසුව මුදාහැරි, මයිකල් මනෝකුමාරගේ මරණය මී පාසානම් විස වීමෙන් සිදු වුවක් බවට නිගමනය කරනු ලැබ තිබේ. අගෝස්තු 27 දා කඩවත පොලිසිය අත්අඩංගුවට ගත් ගාර්ලින් සන්ජීව, පොලිස් සිරකුඩුව තුළම එල්ලී මිය ගොස් සිටි බව අනාවරණය වේ. ඔහුගේ මරණය සියදිවි හානිකර ගැනීමක් සේ නිගමනය කර ඇත. අගෝස්තු 28 දා මතුරට පොලිසිය විසින් ආර්. එම්. ලොකුබණ්ඩා අත්අඩංගුවට ගත් අවස්ථාවේදී, ඔහු පපුවේ වේදනාවක් ඇති බව කී හෙයින්, මතුරට රෝහලට ඇතුළත් කළේය. රෝහල් බලධාරීන් පවසන අන්දමට ඒ අය මිය යාමට හේතුව ස්වාභාවික හෘදයාබාධයක් බවට නිගමනය කරනු ලැබ ඇත.

2001 වර්ෂය තුලදී අත්අඩංගුවේ සිටියදී මියගිය, කනපතිපිල්ලේ උදයකුමාර් සහ ගුවන් හමුදා නිලධාරීන් විසින් ඝාතනය කරනු ලැබීයයි සැක කෙරෙන, සිවඥානම් මනෝහරී ගැන ඉන් වැඩියමක් දැනගැනීමට නැත.

ආරක්‍ෂක අංශයේ නිළධාරීන්, ප්‍රකට නඩු කිහිපයකම සිද්ධීන්ට හවුල් වී ඇති බව අදාල වර්ෂය තුළදී රජය විසින් පිළිගනු ලැබුවද, ආරක්‍ෂක අංශවල අයට වැරදිවලට නිසි දඬුවම් නොමැති වීම, තවමත් බලගතු ප්‍රශ්නයකි. වර්ෂය අවසාන වනවිට, රජය ස්ත්‍රී දූෂණ නඩු 5ක්, වදහිංසා කිරීමේ සිද්ධීන් 5ක් සහ ආගිය අතක් නැති අයවලුන් පිළිබඳ සිද්ධීන් 500 ක පමණ සංඛ්‍යාවක් සම්බන්ධයෙන් ආරක්‍ෂක නිළධාරීන්ට එරෙහිව පරීක්‍ෂණ කටයුතු අරඹා තිබිණි. 1996 වසරේදී විශ්ව විද්‍යාල ශිෂ්‍යාවක වූ ක්‍රිෂාන්ති කුමාරිස්වාමි ඝාතනය කිරීම සම්බන්ධයෙන් රජය ආරක්‍ෂක නිළධාරීන් හය දෙනකු වරදකරුවන් බව තීන්දු කර තිබේ.

2000 වසරේදී දමිළ ජාතික සිවිල් වැසියන් නව දෙනකුට වධහිංසා පමුණුවා, මිරුසුවිල් නැමැති ස්ථානයේදී අට දෙනකු ඝාතනය කිරීමේ වරදට යුද හමුදාවේ සෙබලුන් පස් දෙනකුට එරෙහිව, අනුරාධපුර මහේස්ත්‍රාත් උසාවියේ නඩුවක් විභාග විය. එයට පෙර යුදහමුදා අණදෙන නිළධාරියෙකු විසින්, හමුදා සෙබලුන් නව දෙනකුට ඔවුන්ගේ වැටුප් අත්හිටවීමෙන් පරිපාලන මට්ටමින් දඬුවම් පමුණුවා තිබිණි. (1-බී සහ 1-සී බලන්න)

2000 වසරේ බිඳුනුවැව පුනරුත්ථාපන කඳවුරේදී දමිළ ජාතිකයන් 27 ක් මරුමුවට පත් කිරීමේ චෝදනාව මත පොලිස් නිළධාරීන් 2 කුද ඇතුළු පුද්ගලයන් 5 දෙනකුට ජුලි මස 01 දා, මරණීය දණ්ඩනය නියම කරන්නට යෙදුණි. එම දඬුවම නොපමාවම වසර 23 බැගින් වන බරපතල වැඩ සහිත සිරදඬුවමක්

තෙක් ලිහිල් කරන්න යෙදුනි. කලින් එම සිද්ධිය විභාග කළ උසාවියේදී එක් පොලිස් නිළධාරියකුද ඇතුළුව වුදිතයන් 23 දෙනකු ජනවාරි මස 04 දා නිදහස් කෙරිනි. මානව හිමිකම් කොමිසම සඳහන් කළේ පොලිස් නිළධාරීන් බරපතල අන්දමින් රාජකාරී පැහැර හැර ඇති බවය. පොලිසියට චෝදනා එල්ල වී තිබුනේ රැඳවියන් ඝාතනය කිරීම සහ රැඳවුම් කඳවුරට ගම්වැසියන් කඩාවැදීම, වලක්වා ලීමට කිසිදු පියවරක් නොගැනිම යන කරුණු මතය. එම ඝාතනයෙන් පසුවද එහි භිෂණ ක්‍රියා පැවති අතර, සතියක් ගතවන තෙක්ම තත්වය සපුරා පාලනය කර ගැනිමට පොලිසිය අපොහොසත් විය.

ඉන් පෙර වසර කිහිපයක් තුළ සිදු කර ඇති අධිකරණ බාහ්‍ය (□□□□□ □□□□□□□□□) ඝාතන කිහිපයක්ම, එල්.ටී.ටී.ඊ සංවිධානය විසින් ආරක්‍ෂක නිළධාරීන් හෝ සිවිල් වැසියන් හෝ මරා දැමීමට හෝ තුවාල සිදු කිරීමට හෝ එරෙහිව පළිගැනිමිය. එවැනි අවස්ථා කිහිපයකදීම ආරක්‍ෂක හමුදා කියා සිටියේ මරාදමනු ලැබූ අයවලුන් එල්.ටී.ටී.ඊ, සාමාජිකයන් බවය. එහෙත් මානව හිමිකම් නිරීක්‍ෂකයන් පැවසුවේ එය සත්‍යයෙන් තොර ප්‍රකාශයක් බවය. ත්‍රිකුණාමල ප්‍රදේශයේ තම්පලාගමුවේදී දමිළ ජාතික සිවිල් වැසියන් අට දෙනකු 1998 වසරේදී ඝාතනය කිරීම සම්බන්ධයෙන් අධිචෝදනා ලත් පොලිස් නිළධාරීන් අට දෙනකුට විරුද්ධව නඩුවක් විභාග විය. දළදා මාලිගාවට එල්.ටී.ටී.ඊ සංවිධානය බෝම්බ ගැසීමේ වරදට පළිගැනිමක් වශයෙන් පොලිසියත් ග්‍රාමරක්‍ෂකයනුත් එක් සිවිල් වැසියකු මරා දැමීය.

ඉදා කාමලිතා නැමැති ද්‍රවිඩ තරුණිය සාමුහික දූෂණයට ලක් කර මරා දැමීමේ වරදට 1999 වසරේදී අත්අඩංගුවට ගත් යුද සෙබලුන් පස් දෙනාට විරුද්ධව නඩුව විනිශ්චයට ගත්තේද එම වසරේදීමය. 1996 වසරේදී ආරක්‍ෂක හමුදා විසින් ඝාතනය කරනු ලැබූ බව කියන, පුද්ගලයන් 400 කගේ පමණ මළ සිරුරු යටකර තිබූ චෙම්මනායි සමුහ මිනිවල පිළිබඳ නඩුව විසඳමින් තිබිණි. ස්වකීය උසස් නිළධාරීන්ගේ නියෝග මත මළ සිරුරු 120-140 අතර සංඛ්‍යාවක් චෙම්මනායි ප්‍රදේශයේම වළ දැමූ බවට යුද සෙබලුන් 6 දෙනකුට විරුද්ධව චෝදනා කරනු ලැබීය. 1999 වසරේදී මිනී වලවල් හාරා බැලීමේදී 15 දෙනකුගේ ඇටකටු ගොඩ ගන්නට යෙදුනි. ඉන් දෙදෙනකුම 1996 වසරේදී ආගිය අතක් සොයා ගත නොහැකිව තිබුනු තරුණයන් දෙදෙනකුගේ මළ සිරුරු බව හඳුනා ගන්නට හැකිවිය. 2001 වසර වන විටද, සෙසු සිරුරු 13 හඳුනා ගැනිමට නොහැකිව තිබිණි. කලින් පොලිස් නිළධාරියකුව සිටි අයකු ඇතුළු ආරක්‍ෂක නිළධාරීන් 20 දෙනකු එම ඝාතන වලට වගකිව යුතු බව සොල්දාදුවන් 6 දෙනකු පවසා තිබිණි. හඳුනා නොගත් ඉතිරි මළ සිරුරු, හඳුනා ගැනිමේ පියවරක් වශයෙන් ඩි.එන්.ඒ පරීක්ෂණයකට භාජනය කරන්නට යෙදුනි. පරීක්ෂණයේ මූලික ප්‍රතිපල සම්බන්ධයෙන් තමන්ට සෑහිමකට පත්විය නොහැකි හෙයින්, නීතිපතිවරයාගේ කාර්‍යාලය, වඩාත් විස්තරාත්මක වුද ඵලදායි වුද පරීක්ෂණයක් සඳහා මූල්‍ය අවශ්‍යතා සෙවූ බවද දැන ගන්නට තිබේ.

1992 වසරේ මයිලන්තනෙයි ගමේදී මරා දමනු ලැබූ, ද්‍රවිඩ වැසියන් 35 දෙනා වෙනුවෙන් පෙනීසිටි, නියෝජිත පිරිසක් කියා සිටියේ එම ඝාතන වලට වගකිව යුතු සොල්දාදුවන් 21 දෙනා, 2002 වසරේදී නිදහස් කිරීමට විරුද්ධව, නීතිපතිවරයා අභියාචනාවක් ඉදිරිපත් කළ යුතු බවය.

ද්‍රවිඩ දේශපාලනඥයකුවූ කුමාර් පොන්නම්බලම් මහතා 2000 වසරේදී ඝාතනය කළ සැකකරුවාද

තවත් නොහඳුනන අයකු විසින් ඝාතනය කරනු ලැබීය. නඩු පවරන ලද්දේ ඉතිරි අනෙක් සැකකරුවාට එරෙහිවය.

අතීතයේ එවැනි ඝාතන කිහිපයකටම වගකිව යුතු අයවලුන් වූයේ ටෙලෝ සංවිධානය සහ රසික් කණ්ඩායම වුවද, ඔවුන් එවැනි ඝාතන කළ බවක්, එම වසර තුල වාර්තා වී නොතිබිණි. එල්.ටී.ටී.ඊ ත්‍රස්වාදීන් හඳුනා ගැනීම සඳහා ඔත්තු සැපයීමටත්, අවශ්‍ය විටෙක ත්‍රස්වාදීන් හා සටන් කිරීමටත්, මෙවැනි කණ්ඩායම් සහ වෙනත් යුදවාදී ද්‍රවිඩ සංවිධාන, ආරක්‍ෂක හමුදා විසින් සන්නද්ධ කර තිබිණි. එසේ සන්නාහ සන්නද්ධ කරනු ලැබූ කණ්ඩායම්වල ප්‍රමාණය නිශ්චිත වශයෙන් දැන ගත නොහැකිය. එහෙත් 2000 කට වැඩි නොවූ බව සිතිය හැකිය. 2000 වසරේ පෙබරවාරි මාසයේදී රජයත් එල්.ටී.ටී.ඊ සංවිධානයත් අතර ඇති කරගත් සටන් විරාම ගිවිසුමෙන් පසුව, ඔවුන් නිරායුද කරන්නට කටයුතු යොදනු ලැබීය. එම කණ්ඩායම් තමන් සතුව තිබුණු අවි ආයුධ රජයට භාරදුනි. එහෙත් ඒ අතර, අවි වලින් කිසියම් කොටසක් තවදුරටත් තමන් වෙත රඳවා ගත්බව ඇතැමෙක් විශ්වාස කරති. එම කණ්ඩායම් විසින් ඝාතනය කරනු ලැබූ පිරිස් අතර, එල්.ටී.ටී.ඊ සාමාජිකයන් මෙන්ම කප්පන් දීමට අකමැති වූ සිවිල් වැසියන්ද ඇතුලත්ය.

එල්.ටී.ටී.ඊ සංවිධානයට එරෙහි වෙනත් ද්‍රවිඩ දේශපාලන සංවිධානවලට අයත් වූවන් සහ විශේෂයෙන් උතුරු නැගෙනහිර දෙපළාතේ සිට ආරක්‍ෂා හමුදා අංශ වලට ඔත්තු සැපයූවන්, 36 දෙනකුට වැඩි සංඛ්‍යාවක් එල්.ටී.ටී.ඊ, සංවිධානය විසින් වසර තුළදී, ඝාතනය කළ බවට විශ්වාසනීය සාක්ෂි ලැබී ඇත. තම සංවිධානයට කලින් විරුද්ධව ක්‍රියා කළ අයවලුන් මෙන්ම, දැනට ඔවුන්ට එරෙහි අයවලුන්ද එල්.ටී.ටී.ඊ සංවිධානයේ ගොදුරු බවට පත් වූහ. ජූනි මාසයේදී ඊ.පී.ආර්.එල්.එෆ් සංවිධානයේ නියෝජ්‍ය නායකයා යාපනයේදී වෙඩිතබා මරා දමනු ලැබීම එවැනි සුප්‍රකට සිද්ධියක් ලෙස දැක්විය හැකිය. හමුදාවට ඔත්තු සැපයූ බවට සැක කරනු ලැබූ ද්‍රවිඩ ජාතිකයන් කිහිප දෙනකුද වසර තුලදී එල්.ටී.ටී.ඊ සංවිධානයේ ගොදුරු බවට පත්වූහ. කොළඹදී පොලිස් නිලධාරියකුද එසේ මරාදමනු ලැබිය .එයද එල්.ටී.ටී.ඊ සංවිධානයේ ක්‍රියාවකි.

අවි සහ පුපුරන ද්‍රව්‍ය සහිත එල්.ටී.ටී.ඊ සංවිධානයට අයත් යාත්‍රාවකියි සැක කරනු ලැබ, මාර්තු හා ජූනි මාස තුළදී නාවික හමුදාව මගින් යාත්‍රා කිහිපයක් ගිල්වාලීමේ සිද්ධීන් හැරනු විට, රජයේ හමුදා සහ එල්.ටී.ටී.ඊ ය අතර, ගතවූ වසරේදී මෙන් මෙම වසර තුලදී සටන් සිදුවනු දක්නට නොතිබිනි . ඒ සෑම අවස්ථාවකදීම එල්.ටී.ටී.ඊ සමාජිකයන් කිහිපදෙනකු මරනයට පත්විය. වසර තුළ මරාගෙන මැරෙන බෝම්බ කරුවන් පිලිබඳ වාර්තා වී නැත.

## බී. පුද්ගලයන් පැහැරගෙන යාමේ සිද්ධි

ආරක්‍ෂක හමුදා විසින් දේශපාලන හේතු මත කරනු ලැබීයයි සැලකෙන, සිද්ධීන් කිසිවක් වර්ෂය ඇතුළත වාර්තාගත වී නැත. 2000 වසරේදී මුරුසුවිල් ගමේ ද්‍රවිඩ සිවිල් වැසියන් අට දෙනකු ආගිය අතක් නැති බවට වාර්තා ලැබිණි. එම වසර අවසානයේදී මිනී මැරුම් චෝදනා මත යුද සොල්දාදුවන් පස් දෙනකුට විරුද්ධව නඩු පවරන ලදි. (1ඒ සහ 1බී බලන්න)

2000 වසරේදී නාවික භටයන් විසින් ත්‍රිකුණාමල ප්‍රදේශයේදී ධීවරයකු අත්අඩංගුවට ගනු දක්නට ලැබිනි. එහෙත් ඉන්පසු ඒ ධීවරයා දක්නට නොසිටියේය. 2002 වසරේ ඒ පිළිබඳ හඳුනාගැනීමේ පෙරෙට්ටුවක් මහාධිකරණ නියමය මත පැවැත්වුවද, සැකකරුවන් කිසිවකුත් හඳුනා ගැනීමට සාක්ෂිකරුවෝ අපොහොසත් වූහ. එම සිද්ධිය සම්බන්ධයෙන් 2002 වසරේදී මහාධිකරණය හබයාස් කෝපුස් පෙත්සමක් විභාග කළේය. එහෙත් වසර අවසන් වන තෙක් එයට වැඩි යමක් දක්නට නොතිබිනි.

2001 වසරේදී සහ එයට පෙර වසර වලදී අවතැන් වුවන්, මියගියාසේ සලකන ලදී. බලෙන් පැහැරගනු ලැබූ හෝ අවතැන් කරනු ලැබූ පුද්ගලයන් පිළිබඳ එක්සත් ජාතින්ගේ ක්‍රියාකාරී කණ්ඩායම, ඒ අනුව, කලේ නොවිසඳුණු අවතැන් වුවන් විශාල ප්‍රමාණයක් ඇති රටක් වශයෙන් ශ්‍රී ලංකාව ලේඛණගත කිරීමයි. යුද හමුදාපති සහ පොලිස්පතිවරයාද එසේ අවතැන් වුවන් ගැන කණගාටුව පළ කළ අතර, එයට වගකිව යුත්තන් නීතිය ඉදිරියට මෙහෙයවන බවද ප්‍රකාශ කළහ.

1994 කොමිෂන් සභා තුනක්ද 1998 එක් කොමිෂන් සභාවක්ද යනුවෙන් කලාපීය කොමිෂන් සභා හතරක් පතකරන ලදී. 1988 සහ 1994 කාලය තුළ පුද්ගලයන් 21,215 ක් අතුරුදන් වී ඇති බව එම කොමිසන් සභා වාර්තා කළහ. ඉන් වැඩිම අතුරුදන් වීම් ප්‍රමාණයක් සිදුවී ඇත්තේ ජනතා විමුක්ති පෙරමුණේ විප්ලවීය යුගයට අදාල 1988 -1989 අතර කාලයේදීය. මිනිසුන් බහුතරයක්ම අතුරුදන්වී ඇත්තේ ,අකමැත්තෙන්ම බලකිරීම් මත ස්වකීය නිවෙස් වලින් ගෙන යාමෙන් පසුව බවත්, මෙවැනි සිද්ධින්ට වැඩියෙන්ම ආරක්ෂක හමුදා මැදිහත් වී ඇති බවත් කොමිසම අනාවරනය කරයි . මෙවන් සිද්ධින් බොහොමයක් අදාල උප දිසාපති කාර්‍යාල මගින් පරීක්ෂන පවත්වාගෙන ගියද, වසර ඇතුලත එහිලා කිසිදු ප්‍රගතියක් දක්නට නොතිබුණි.

බිඳුනු වැව ඝාතනයට (1ඒ බලන්න) සහ මිරුසිවිල් ඝාතනයට සැක කෙරුණු ආරක්ෂක නිලධාරීන්ට විරුද්ධව පරීක්ෂන සහ අධි චෝදනා පත්‍ර නිකුත් කිරීම ඇතුලු නඩු පැවරීම් කිහිපයක්, මෙම වසර තුළ සිදුවිය. 1996-1997 කාලය තුළ යාපන ප්‍රදේශයෙන් අතුරුදන්වූ අයවලුන් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්විම සඳහා, 2002 නොවැම්බර් මාසයේ, රජය පරීක්ෂණ කොමිසමක් පත්කළ නමුත් අදාල වර්ෂයේ තුළදී කොමිසම ඒ පිළිබඳ කිසිම පියවරක් ගෙන නැත .

බලහත්කාරයෙන් පුද්ගලයන් අතුරුදන් කිරීම පිළිබදව, එක්සත් ජාතින්ගේ ක්‍රියාකාරී කණ්ඩායමක් විසින් 1999 වසරේ නිකුත් කරනලද වාර්තාවට අනුව, ත්‍රස්තවාදය වැලක්වීමේ පනත සහ හදිසි නීතිය, පුද්ගලයන් අතුරුදන් විමට අදාල වැදගත් සාධක වශයෙන් සඳහන් කර තිබුනු අතර එම පනත් අහෝසි කිරීම හෝ මානව හිමිකම් පිළිබද ජාත්‍යන්තර අවශ්‍යතාවලට සරිලන අන්දමින් සංශෝධනය කිරීම හෝ කලයුතු බවද නිර්දේශ කර තිබිණි . හදිසි නීතිය 2001 වසරේදී අවලංගු කරන ලදී. 2002 වසරේ හෝ මෙම වසරේ හෝ ත්‍රස්තවාදය වැලක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගැනීම් කිසිවක් දක්නට නොතිබිනි . කෙසේ වුවද රැදවුම් නියෝග වැනි ලේඛණගත අවශ්‍යතා රහිතව අත්අඩංගුවට ගැනීම් කිහිපයක් දක්නට ලැබිනි. ත්‍රස්තවාදී ක්‍රියා වැලක්විමේ පනත යටතේ කලින් රදවා ගත් පුද්ගලයන් සියලු දෙනාම වර්ෂය අවසාන වන විටත්, රජය මුදාහැර නොතිබිනි . (1 ඩී බලන්න) ඇතැම් කරුණු වර්ෂය තුළදී සමාලෝචනය කරන්නට යෙදුනි.

කලින් පොදු පෙරමුණ රජය හා සම්බන්ධව සිටි ද්‍රවිඩ ත්‍රස්තවාදින්ද, ගතවූ වසරේ සිදුවූ අතුරුදන් වීම් වලට වගකිව යුතුය. කෙසේ වුවද මෙම වසර තුළදී එවැනි අතුරුදන් වීම් පිළිබඳව වාර්තා දක්නට නැත. ත්‍රස්තවාදී කණ්ඩායම් විසින් කරනු ලබන වැරදි පිළිබඳ, පරීක්ෂා කිරීමේ බලයක් මානව හිමිකම් කොමිසම සතු නොවේ. එවැනි කණ්ඩායම්වල ක්‍රියාකාරිත්වය අතිශයින්ම රහසිගතව සිදුවන්නක් බැවින් එසේ ත්‍රස්ත ක්‍රියාවලට ගොදුරු වූ පුද්ගලයන්ගේ නිශ්චිත සංඛ්‍යාව දැන ගැනිමට නොපිළිවන. 2002 වසරේදී මෙම ත්‍රස්තවාදී කණ්ඩයම් නිරායුධ කිරිමට රජය ක්‍රියා කළේය. එසේම 2002 වසරේදී එල්.ටී.ටී.ඊ සංවිධානය යුද භටයන් කිහිප දෙනකුද සහිත 10 දෙනකු ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය හරහා නිදහස් කොට මුදා හැරීය. වර්ෂය අවසාන වනවිට එල්.ටී.ටී.ඊ යටතේ රඳවාගත් දේශපාලන සිරකරුවන් තවදුරටත් නොවූ බව පළ වුවද, ඇතැම් තතු දත් අයවලුන්ගේ අදහස වූයේ තවත් සිරකරුවන් එම සංවිධානය සතුව සිටින බවය. (1 ජී බලන්න )

### සී. වධහිංසා ඇතුලු වෙනත් අමානුෂික දඬුවම්

1994 - වධ හිංසා කිරීමට විරුද්ධ සම්මුතිය අනුව, හිංසා කිරීම දඬුවම් කලයුතු වරදකි. අත්අඩංගුවට ගනු ලැබූවන්ගෙන් ප්‍රශ්න කිරීමේදි, විශේෂයෙන් ආරක්‍ෂක හමුදා නිලධාරීහු, ඔවුන්ට අයතා බලපෑම් කිරීමත් හිංසා පැමිණවීමත් කරති. වධ හිංසා පැමිණවීම වසර 7 ක අවම සිර දඬුවමක් ලැබිය හැකි වරදක් ලෙස එම පනතේ විග්‍රහ කර තිබේ. මෙවැනි වැරදි සඳහා මහාධිකරණයෙන් දඬුවම් පැමිණවීමට විධිවිධාන සලසා ඇත. වධහිංසා කිරීමට විරුද්ධ සම්මුතිය (CATA), එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට සපුරා එකඟයයි රජය පවසන නමුත් රජය එක්සත් ජාතින්ගේ සම්මුතියේ ඇතැම් විධිවිධාන ක්‍රියාත්මක නොකරයි. මානව හිමිකම් රැකීමේ කණ්ඩායම් කියන පරිදි මෙම තත්වය යටතේ, ඇත්ත වශයෙන් සිදුවී ඇත්තේ වධහිංසා පැමිණවීම, යම් යම් විශේෂ තත්වයන් යටතේ තහනම් වුවද, ඇතැම් තැනෙක කිසිදු දඬුමකින් තොරව එය සිදුවීමය. එපමණක්ද නොවේ. ත්‍රස්ථ ක්‍රියා වැලැක්වීමේ පනත යටතේ උද්ගතවන අනෙක් අහිතකර තත්වය වන්නේ හුදෙක් හිංසා පීඩන හෝ එවැනි ඕනෑම පීඩාකාරී වතාවරණයක් යටතේ ලබා ගන්නා පාපොච්චාරනයක් මත වුවද, අධිකරණයක් ඉදිරියට පමුණුවන තෙක් පුද්ගලයකු දිගු කලක් රඳවා ගැනිමට ඉඩ සලසා තිබීමය. ඇතැම් අවස්ථා වලදී එසේ රඳවා ගැනිම එක් වසරක් තරම් දීර්ඝ කාලයක් දක්වා සිදු විමටද ඉඩ තිබේ. (1සී බලන්න.)

විද්‍යුත් තරංග වැද්දීම, විකෘති ඉරියව්වෙන් සිටින සේ අත් පා වලින් එල්ලා තැබීම, සිරුර පිළිස්සීම, වෘෂණ කොෂය මේස ලාච්චු තුළ තබා පියන තද කිරීම, මුව තෙක් දියේ ගිල්වීම යනාදිය භාවිතා කරනු ලබන හිංසා ක්‍රමවලට ඇතුලත්ය. තවත් අවස්ථාවලදී සැක කරුවන් අස්භාවික දුෂ්කර ඉරියව්වකින් දීර්ඝ කාලයක් සිටීමට හෝ කෘමි නාශක, මිරිස් කුඩු හෝ පැට්‍රල් වැනි දෙය පිරවූ බෑගයකින් හිස ආවරණය කර තැබීමද කරනු ලැබේ. වධහිංසා කිරිම නිසා ඇට බිඳී ඇති බව රැඳවියන් පවසා ඇත. එසේම අත්අඩංගුවේ සිටියදී මරණයට පත්වූ අයවලුන් ගැනද අසන්නට ලැබේ. (1ඒ බලන්න) 2000 වසරේ සිට මේතාක් අත්අඩංගුවට ගනු ලැබූ රැඳවියන්ට විවිධ වධහිංසා පමුණුවා ඇති බව, වෛද්‍ය වාර්තාවලින් කොතෙකුත් අනාවරණය වී ඇත.

ආරක්‍ෂක හමුදා නිළධාරීන් සිර භාරයේ සිටින අයවලුන්ට වධහිංසා කළ බවට රාජ්‍ය නොවන සංවිධාන වලින්ද විශ්වාසනිය වාර්තා ලැබී ඇත. නොවැම්බර් මස 01 වන දින බමුණුආරච්චි පතිරනලාගේ සත්කුමාර නැමැති අය කුලියාපිටිය පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබ වධහිංසා කළ බවට, ආසියානු මානව හිමිකම්

කොමිසම (AHRC) සහ හිංසාවට එරෙහි ලෝක සංවිධානය (OMCT) ඉදිරිපත් කරන කරුණු එහිලා නිදසුන් වශයෙන් දැක්විමට පිළිවන. අත්අඩංගුවට ගැනීමට හේතුව ඒ තැනැත්තාට දන්වා නැත. පොලිසියේදී ඔහුගේ දෙ අත් පිටුපසට තබා බැඳ සිලිමේ බාල්කයක එල්ලා පහර දී ඇතත්, එදින ඔහු මුදවා හැරීමේදී, පොලිසිය ඔහුට අවවාද කර ඇත්තේ, කිසිදු රෝහලකට ප්‍රතිකාර සඳහා නොයන ලෙසයි. කෙසේ වුවද සත්කුමාරගේ සොහොයුරා, ඔහු කුලියාපිටිය රෝහලට ඇතුළත් කොට දින 3 ක් නේවාසිකව ප්‍රතිකාර ලබා දී ඇති අතර, කුරුණෑගල පොලිසියට සිද්ධිය සම්බන්ධයෙන් පැමිණිලි කර ඇත. ආසියානු මානව හිමිකම් කොමිසම (AHRC) සහ හිංසාවට එරෙහි ලෝක සංවිධානය (OMCT) තව දුරටත් සපයන තොරතුරු අනුව, සැප්තැම්බර් 13 දාත් ඉන්පසු දින කිහිපයකදීත් 16 වියැති භික්කඩුව ලියනගේ සඳුන් කුමාර නැමැත්තාට රත්ගම පොලිසියේදී තදබල අන්දමින් පහර දෙනු ලැබ තිබේ. කුමාරගේ හිස ඔහුගේම කමිසයෙන් වෙලා බැඳ හුස්ම ගැනීමට අපහසු වන අන්දමින් ඔහුගේ මුහුණට වතුර වත්කර, තලා පෙලා ඔහුගේ හිස බිත්තියේ හප්පා ඇත. සැප්තැම්බර් 21 සහ 23 යන දිනවල ඔහු කරාපිටිය ශික්ෂණ රෝහලෙන් ප්‍රතිකාර ලබාගෙන තිබේ. මෙම සිද්ධිය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙස මහාධිකරණය, ජාතික පොලිස් කොමිසමට නියෝග කර ඇති බව ඉහත කී සංවිධාන දෙක ප්‍රකාශ කරති.

යාපනයේ ආරක්ෂක හමුදා විවේචනය කළ ශිෂ්‍ය නායකයකු වු තිව්‍යාන් ක්‍රිෂ්නසාමි අත්අඩංගුවට ගනු ලැබ 2002 මාර්තු මාසයේදී මුදා හැරියේය. පොලිසිය ඒ තැනැත්තා, එල්.ටී.ටී.ඊ සාමාජිකයකු බව කියතත් මානව හිමිකම් නිරීක්ෂකයන් කියන්නේ ඔහු හිරභාරයට ගැනීමට හේතුව, දේශපාලන කටයුතු වල නිරත වීම නිසා බවය. 2001 වසරේදී හිරබාරයට ගැනීමෙන් පසුව, තමන්ට වධහිංසා පමුණුවන ලද බවට, ඔහු පැමිණිලි කර තිබේ. යාපනය විශ්ව විද්‍යාල සිසුන් එහිලා විරෝධය දක්වා ඇති අතර, උද්ඝෝෂණය මඟ හැරලීම පිණිස, විශ්ව විද්‍යාලය තාවකාලිකව වසා දැමීමට පවා සිදුවී තිබේ. ඒ පිළිබඳ වැඩිදුර ක්‍රියාකර නැත.

අත්අඩංගුවේ සිටියදී බලෙන් දූෂණය කිරීම් හා ලිංගික අපචාරවලට යොදා ගැනීම්, බරපතල ප්‍රශ්නයක්ව පැවති අතර, ඒ සම්බන්ධව නඩු කිහිපයක්ම අධිකරණයට ඉදිරිපත් කර තිබේ. ජාත්‍යන්තර ක්ෂමා ආයතනය ඉදිරිපත් කරන තවත් සිද්ධියකට අනුව 2002 මාර්තු මාසයේ, හොරකමක් සම්බන්ධයෙන් සිරබාරයට ගනු ලැබූ නන්දනී හේරත් නැමැත්තිය, වාරියපොල පොලිසියේදී ලිංගික අපයෝජනයට යොදාගෙන ඇති බව කියනු ලැබේ. වාරියපොල පොලිස් ස්ථානාධිපතිවරයාට එරෙහිව ජූලි 14 වනදා 1994 හිංසා කිරීමේ පනත යටතේ මහාධිකරණයේ පවරා තිබුනු නඩුවෙන්, ඔහු ඇපපිට මුදා හැර තිබේ. ඉන්පසු තවත් පොලිස් නිලධාරීන් පස් දෙනකුටද එම චෝදනාව එල්ල වී ඇත. හේරත්ට සහ ඇගේ පියාට නඩුව අස්කර ගන්නා ලෙස, පොලිසිය තර්ජනය කළේය. ඒ පිළිබඳව වෙනත් කිසිදු ප්‍රගතියක් වසර අවසානය තෙක් දැන ගන්නට නැත. 2001 වසරේ මන්නාරමේදී අත්අඩංගුවට ගනු ලැබූ කාන්තාවන් 2 නකු නාවික හා පොලිස් නිලධාරීන් විසින් කිහිප වතාවක්ම දූෂණයට හා වධ හිංසාවන්ට ලක් කළ බවට පැමිණිලි කර ඇත. නිළධාරීන් 14 දෙනකුට විරුද්ධව එම චෝදනා දෙක මත නඩු පවරන ලදී. චූදිතයන් දෙදෙනකු නිදහස් කර ඇති අතර, වසර අවසානය තෙක්ම නඩුව විභාග වෙමින් පැවතිනි. චූදිතයන්ට විරුද්ධව මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන්ද නඩු පවරනු ලැබීය. (ඊළඟ ඡේදය බලන්න) තවත් ආරක්ෂක නිළධාරීන් හතර දෙනකුට එරෙහිව, අත් අඩංගුවේ සිටියදී ස්ත්‍රීන් දූෂණය කිරීම සම්බන්ධ නඩුවක් වසර අවසානය තෙක් විනිශ්චය වී නැත.

වධහිංසාවට ලක් වු අයවලුන්ට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, මූලික මානව හිමිකම් විධිවිධාන යටතේ, මහාධිකරණයේ නඩුවක් ගොනු කිරීමට අවකාශ සලසා තිබේ. අධිකරණය මගින් ඩොලර් 150 (රු.14,200/-) සිට ඩොලර් 1940 (රු.182,500/-) තෙක් ප්‍රමාණයේ වන්දි ලබා දී තිබේ. ඇතැම් අවස්ථා වලදී වධහිංසා පැමිණවූ ආරක්ෂක නිළධාරීන් වරදකරුවන් වු විට ගෙවිය යුතු වන්දි මුදල ගෙවීමට, රජයද ඉදිරිපත් වී නැත. එවැනි වන්දි ගෙවිය යුත්තේ රජය විසින්ද නොඑසේනම් වරදකරු විසින්ද යනු නිගමනය වනුයේ අධිකරණ තීන්දුව අනුවය.

නීතිපති කායඝිලයත් අපරාධ පරීක්ෂණ අංශයත් එවැනි වධහිංසා පිළිබඳ පැමිණිලි පරීක්ෂා කිරීමට ඒකක පිහිටුවා ඇත. අධිචෝදනා සඳහා එම ඒකක මගින්, සිද්ධීන් 50 ක් ඉදිරිපත් කරන ලදි. ඉන් 20 කට අපේක්ෂිත පරිදි අධි චෝදනා සකස් කළ නමුත්, චූදිතයන් වරදකරුවන් බවට පත් කළ බවක් දැන ගන්නට නැත. අන්තර් පාර්ලිමේන්තු ස්ථාවර කමිටුවත් එයට අදාල මානව හිමිකම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමත් මෙවන් වධහිංසා පිළිබඳ පරීක්ෂණ කෙරෙහි අවධානය යොදා ඇත.

තවත් එතරම් බරපතල නොවන වැරදි ක්‍රියා කිහිපයක්ම යුද හමුදාව සිදු කර තිබේ. යාපනයේ ජේදුරුතුඩුවට නුදුරු මුනායි නැමැති ස්ථානයේදී, ඔක්තෝබර් 22 දා යුද සෙබලුන් විසින්, පහර දෙනු ලැබීම හේතු කොට ගෙන, සිවිල් වැසියන් 20 දෙනකුට තුවාල සිදුවී ඇති බව, සරණාගතයන් පිළිබඳ මණ්ඩලය පෙන්වා දීම නිදසුනක් වශයෙන් දැක්විය හැකිය. දෙසැම්බර් මස 8 දා යාපනයේදී යුද සොල්දාදුවන්, බස් කොන්දොස්තරවරයකුට වෙඩි තබා බරපතල තුවාල සිදු කිරීම තවත් එවැනි සිද්ධියකි. මෙම සිද්ධිය සම්බන්ධයෙන් යාපනේ මහේස්ත්‍රාත්වරයා සෙබලුන් තිදෙනකු රිමාන්ඩ් භාරයට යවා තිබේ.

මිරුසුවිල් ප්‍රදේශයේදී හමුදා සෙබලුන් විසින් වධහිංසා කොට මරා දමනු ලැබීයයි කියන ද්‍රවිඩ ජාතිකයන් 8 දෙනාගේ මළ සිරුරු, 2000 වර්ෂයේදී ගොඩ ගැනීමට අදාලව, වසර අවසානයේ සෙබලුන් පස්දෙනකු උසාවිය ඉදිරියට පමුණුවා තිබේ. (1ඒ සහ 1බී බලන්න)

දඬුවම් පැමිණවීමට නොහැකි වීම ගැටලුවකි. නමුදු නිළධාරීන් සිදු කළායි සැලකෙන මානව හිමිකම් උල්ලංඝණය කිරීම් බහුතරයකදීම චූදිතයන් හඳුනා ගැනීමට හෝ ඔවුන්ට විරුද්ධව ක්‍රියා කිරීමට හෝ රජය අපොහොසත්ව ඇත.

හිංසා කිරීම් පිළිබඳ 2000 වසරේ එක්සත් ජාතීන්ගේ කමිටු වාර්තාව 2001 වසරේදී රජයට භාරදී ඇතත්, වසර අවසානය තෙක්ම එම වාර්තාව ප්‍රසිද්ධියට පත්කොට නැත.

පොදු පෙරමුණට සම්බන්ධ ද්‍රවිඩ ජාතික විප්ලව වාදීන්, වධහිංසා පැමිණවීමෙහි කලින් නිරතව සිටියත්, වර්ෂය ඇතුළත එවැනි සිදුවීම් අසන්නට නොලැබිණි.

එල්.ටී.ටී.ඊ සංවිධානය, ඒ අතර වරින් වර හිංසාකාරී ක්‍රියාවල යෙදී ඇත.

බන්ධානාගාර තුළ පවත්නා තත්වය අතිශයින්ම කණගාටුදායකය. එය ජාත්‍යන්තර මට්ටමට වඩා අඩු මට්ටමක පැවතිමට හේතු, සෞඛ්‍ය තත්වය අඩු වීම හා පිරිස වැඩි වීමය. බන්ධනාගාර වල ගැහැණු, පිරිමි වෙන් වශයෙන් රඳවා ඇත. ඇතැම් විටක බලාවයස්කාර සිරකරුවන්, වැඩිහිටි සිරකරුවන්ගෙන් වෙන් කොට නොතිබිති. එසේම සැකකරුවන්, දඬුවම් ලද අයවලුන්ගෙන් වෙන් කර තැබීමට පියවර ගෙන නැත.

මානව හිමිකම් පිළිබඳ ස්වාධීන නිරීක්ෂකයන්ට සහ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයට, රජයේ රැඳවුම් කඳවුරු, බන්ධනාගාර සහ හමුදා රැඳවුම් මධ්‍යස්ථානවල පවත්නා, පහසුකම් පරීක්ෂා කිරීමට රජයෙන් අවසර දෙන ලදි. 69 වතාවක් පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව එවැනි ආයතන 33 ක් නිරීක්ෂණයට ලක් කරනු ලැබීය. මානව හිමිකම් කොමිසමද ඒ අතරතුර, පොලිස් ස්ථාන 690 කුත්, රැඳවුම් මධ්‍යස්ථාන 96 කුත්, පරීක්ෂා කර තිබේ. (1ඩී බලන්න) ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයේ සහ මානව හිමිකම් කොමිසමේ වාර්තාවන්ට අනුව ඒවායේ පවත්නා සෞඛ්‍ය තත්වය, ජාත්‍යන්තර මට්ටමට වඩා පහත් බව දැනගැනිමට ඇත.

එල්.ටී.ටී.ඊ රැඳවුම් කඳවුරුවල තත්වයද පවතින්නේ පහල මට්ටමකය. එල්.ටී.ටී.ඊ පාලනය යටතේ පවත්නා රැඳවුම් කඳවුරු 8 ක්ද ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයේ පරීක්ෂාවට ලක් වී තිබේ. 2000 වසරේ එම කඳවුරු වලින්, බොහෝ රැඳවියන් මුදා හැර තිබුණු බැවිනුත්, 2002 වසරේදී රඳවා සිටි සොල්දාදුවන් ඉතිරි කොටසද මුදවා හැරී බවට සිතිය හැකි බැවිනුත්, පසුගිය වසරේ පරීක්ෂාවට ලක් කෙරුනේ එල්.ටී.ටී.ඊ කඳවුරු සුළු සංඛ්‍යාවක් පමණි. (1 ඩී බලන්න)

### ඩී. නීති විරෝධී අත්අඩංගුවට ගැනිම්, රඳවා ගැනිම් සහ පිටුවහල් කිරීම්

වර්ෂය තුළදී කරන ලද, අත්තනොමතිකව අත්අඩංගුවට ගැනිම් සහ රඳවා ගැනිම් පිළිබඳව වාර්තාව ලැබී තිබේ. කිසියම් පුද්ගලයකු අත්අඩංගුවට ගත් විට, එසේ කිරීමට හේතුව එම තැනැත්තාට දැන්විය යුතුවන අතර, පැය 24 ක් ඇතුළත මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට පැමිණවිය යුතු බවද, නෛතික අවශ්‍යතාවයකි. අත්අඩංගුවට ගන්නා පුද්ගලයා ටික දිනකට පසුව මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පෙනී සිටිය යුතු අතර, නඩුව විභාග කිරීමට පෙර චූදිතයා මාස 3 ක් හෝ ඊට වැඩි කාලයක් හෝ රඳවා ගත යුතුද යන තීරණය කරනු ඇත. අත්අඩංගුවට ගන්නා විට ඒ බව සඳහන් කෙරෙන රිසිට් පතක් ආරක්‍ෂක අංශ විසින් නිකුත් කළ යුතුය. එම අවශ්‍යතාවය අනුව ක්‍රියා කළ යුතු බවට රජය උපදෙස් දුන්නේ වුවද, පසුගිය වසර කිපය තුළ එවැනි රිසිට් පත් නිකුත් කර ඇත්තේ කලාතුරකිනි. එසේ රිසිට් නිකුත් නොකිරීම නිසා ඒ පිලිබඳ සුල-මුල සොයා යාම අසීරු වනවා පමණක් නොව, රඳවනු ලැබූ තැනැත්තා වැඩිපුර කාලයක් රඳවා ගැනිමත්, වධහිංසා පැමිණවීම ගැනත්, වගකිම කෙළින්ම කෙනකු වෙත නිශ්චිතව පැවරීමටත් නොපුළුවන් වීමේ වාසිය ඇති බැවින්ම, එසේ කරන බව නිරීක්ෂකයෝ පවසති. මෙම වසරේ ඇතැම් සිද්ධීන්ට තවමත් රිසිට් නිකුත් කර නැත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනය යටතේ 2002 වසරේදී, ජාතික පොලිස් කොමිසම

පිහිටුවන ලදි. පොලිස්පතිවරයා හැර සෙසු අය විෂයන්හිලා පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, විනය කටයුතු සහ සේවයෙන් පහ කිරීම්ද ක්‍රියාත්මක කිරීමටත් පොලිසියට විරුද්ධව, මහජන පැමිණිලි විභාග කිරීමේ පටිපාටිය ස්ථාපිත කිරීමටත් සිවිල් වැසියන්ගෙන් සමන්විත ජාතික පොලිස් කොමිසමට බලය තිබේ.

හදිසි නීතිය යටතේ යුද හමුදාව විසින් අත්අඩංගුවට ගනු ලැබූ අයවලුන් සම්බන්ධයෙන්, පොලිසිය හෝ යුද හමුදාව හෝ රිසිට්පත් නිකුත් කිරීම හෝ මානව හිමිකම් කොමිසමට පැය 48 ක් තුලදී දැනුම් දීමක් හෝ නොකළේ වුවද, කලින් අවුරුදු වලදී යුද හමුදාව පැය 24 ක් ගත වෙන්නට මත්තෙන් එසේ රඳවා ගත් සැකකරුවන්, පොලිසියේ භාරයට පත් කිරීමට කටයුතු කර ඇත. එසේ රඳවා ගත් අයවලුන් සිටින ස්ථාන කරා ගොස් පරීක්ෂා කිරීමට මානව හිමිකම් කොමිසමට නෛතික බලයක් ඇතිවා පමණක් නොව, එම තත්වය පොලිසිය විසින්ද ගෞරවන්විතව පිළිගනු ලබන්නකි. දැඩි සීමා කිරීම් හා තහංචි මෙන්ම නිරතුරු පරීක්ෂාවට ලක් කිරීමට ඇති, අපහසුකම් නිසා, එල්.ටී.ටී.ඊ කඳවුරුවල යථා තත්වය පිරික්සීමට ප්‍රමාණවත් අවකාශ නොතිබීම හේතුවකි.

ජුනි මාසය ඇතුළත ද්‍රවිඩ ජාතිකයන් සැලකිය යුතු සංඛ්‍යාවක් අත්අඩංගුවට ගනු ලැබුවද ඉන් බහුතරයක් කෙටි කාලයක් තුලදී මුදවා හැර තිබේ. අතීතයේ එල්.ටී.ටී.ඊ සංවිධානයට එරෙහිව මෙහෙයුම් කරන අතරතුර, රඳවා ගැනීම් බහුලව සිදු කෙරිණි. බොහෝ රඳවා ගැනීම් උපරිම වශයෙන් දින ගණනකට පමණක් සීමා වූ අතර, කිහිපයක් පමණක් මාස ගණනාවක් දක්වා දීර්ඝ ඒවා විය. වසර අවසාන වෙද්දී ඇප නියම කිරීමක් නොමැතිවම, අධිකරණය ඉදිරියට පැමිණවීමට නියමිතව, ත්‍රස්ට ක්‍රියා වැලැක්වීමේ පනත යටතේ රඳවා සිටි ද්‍රවිඩයන්ගේ සංඛ්‍යාව, 65 කි. 2002 වසර තුළදී එම පනත යටතේ රඳවා සිටි ද්‍රවිඩ ජාතිකයන් අතුරෙන් රජය මුදවා හැරි සංඛ්‍යාව 750 කි.

විරුද්ධ පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් හා ද්‍රවිඩ ජාතික නියෝජිතයන්ගෙන්ද සමන්විත වූ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම් සහ හිංසා කිරීම් පිළිබඳ පරීක්ෂා කිරීමේ කමිටුව (CIVAH), එවැනි රඳවා ගැනීම් පිරික්සා අවශ්‍ය කටයුතු කරනු ඇත. එම කමිටුව පිළිබඳ දක්වන ආකල්ප විවිධය. නිශ්චිත අරමුණක් නැතිව කරන රඳවා ගැනීම් අපෛක්ෂිමත් කරන අතරම රැඳවියන්ගේ පවුල් වල සාමාජිකයන්ට විඳීමට සිදුවන හිරිහැර එම කමිටුව හේතුකොට ගෙන අඩුවන බව ඇතැම් මානව හිමිකම් සුරකින පිරිස් විශ්වාස කරති. එහෙත් තවත් ඇතමකු කියා සිටිනුයේ වර්ෂය පුරාම කමිටුව රැස්වන නමුත් සැලකිය යුතු සේවයක් එමගින් සිදු නොවන බවකි.

මහාධිකරණය සහ පෞද්ගලික පුරවැසියන් විසින් ඉදිරිපත් කරනු ලබන අත්අඩංගුවට ගැනීමේ සිද්ධීන්හි, ඇති නීත්‍යානුකූල බව පරීක්ෂා කිරීම, මානව හිමිකම් කොමිසම මගින් කරනු ලැබේ. ආරක්ෂක නිළධාරීන් විසින් අත්අඩංගුවට ගෙන රඳවා තැබීම් පිළිබඳව පරීක්ෂාකාරී වීමටත්, රැඳවුම් කඳවුරු වලට යාමටත්, මානව හිමිකම් කොමිසමට නෛතික බලය පැවරී ඇතත්, ආරක්ෂක නිළධාරීන් නීති රීති උල්ලංඝණය කළ අවස්ථා මෙන්ම, කොමිසමේ අදහස් වලට එකඟ නොවූ අවස්ථාද තිබේ.

රැඳවුම් මධ්‍යස්ථාන ලෙස නිළ වශයෙන් හඳුන්වනු ලබන පොලිස් ස්ථාන සහ යුද හමුදා කඳවුරු 160කට පමණ, බාධාවකින් තොරව ප්‍රවේශ වීමට අවශ්‍ය පහසුකම්, රජය මගින් ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයට සලසා තිබේ. 2001 වසරේදී හදිසි නීතිය නිෂ්ප්‍රභා වීමෙන් පසුව, යුද හමුදා කඳවුරු මගින් අත්අඩංගුවට ගත් පුද්ගලයන්ගේ සංඛ්‍යාව සීග්‍රයෙන් අඩුවූ අතර ඔවුන් යටතේ සිටි රැඳවියන් ඉතා ඉක්මණින් පොලිස් භාරයට මාරු කිරීමද, ගතවූ අවුරුදු වලට වඩා කඩිනමින් සිදුවනු දක්න ලදී. එසේම සටන් විරාම ගිවිසුමද එවැනි අත්අඩංගුවට ගැනීම් අඩු වීමට තවත් හේතුවක් විය.

එල්.ටී.ටී.ඊ සංවිධානයද කලින් සිවිල් වැසියන් රඳවාගෙන, ඒ වෙනුවට වන්දි ඉල්ලා සිටීමට පුරුදුව සිටියේය. වසර තුළදී විශේෂයෙන් නැගෙනහිර ප්‍රදේශයේ මුස්ලිම් ජාතිකයන්, ඒ අන්දමින් රඳවා ගැනීම් පිළිබඳ වාර්තා විශාල සංඛ්‍යාවක් අනාවරණය විය. එසේ රඳවා ගත් මුස්ලිම් ජාතිකයන් වන්දිය ගෙවාලීමෙන් පසුව, නොපමාව මුදා හැර ඇත. එහෙත් වර්ෂය අවසාන වන විට එවැනි සිද්ධීන් තවදුරටත් වාර්තා නොවීය. ප්‍රදේශයෙන් පිටමං කොට නෙරපා හැරීම් සඳහා නෛතික ප්‍රතිපාදන නොමැති බැවින් රජය එවැනි ක්‍රියා කලේ නැත.

## ඊ. සාධාරණ විනිශ්චයකට අවකාශ නොතිබීම

ස්වාධීන අධිකරණයක් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉඩ සලසා ඇති අතර රජය එය ප්‍රයෝගික මට්ටමින්ම සලකා ක්‍රියා කරනු දක්නට ලැබිණි.

ශ්‍රේෂ්ඨාධිකරණයට, මහාධිකරණයට සහ අභියාචනා අධිකරණයට විනිසුරුවන් පත් කරනු ලබන්නේ ජනාධිපති විසිනි. අගවිනිසුරු සහ මහාධිකරණ විනිසුරුවන් දෙදෙනකුගෙන් සමන්විත අධිකරණ සේවා කොමිසම විසින් පහළ උසාවිවල විනිසුරුවන්ගේ පත්වීම් සහ ස්ථාන මාරු සලකා බැලීමට නියමිතය. විෂමාචාර හෝ අනිසි ක්‍රියා හේතුකොට ගෙන විනිසුරුවන් පහ කිරීමේ බලය පැවරී ඇත්තේ ජනාධිපතිගේ සහ පාර්ලිමේන්තුවේ එකඟතාවය මත විධිමත් පරීක්ෂණයකින් පසුවය.

සාපරාධි චෝදනා ජූරි සභාව විනිශ්චය කරන්නේ ප්‍රසිද්ධියේය. චූදිතයන්ට එරෙහි චෝදනා ඔවුන්ට එම අවස්ථාවලදී දන්වන අතර, නීතිඥයකු මගින් කරුණු ඉදිරිපත් කිරීමට හා අභියාචනා ඉදිරිපත් කිරීමටද අවකාශ සලසා තිබේ. මහාධිකරණයේ හා අභියාචනා අධිකරණයේ විනිශ්චය කෙරෙන අපරාධ නඩු සම්බන්ධයෙන් දිළිඳු තත්වයේ සිටින චූදිතයන්ට, නීති උපදෙස් ලබා දීමට රජයෙන් කටයුතු සලසා ඇත. එහෙත් සෙසු නඩු සඳහා එවන් සහයක් නොලැබේ. ඇතැම් වගඋත්තර කරුවන්ට නීති සහාය සපයන පෞද්ගලික නීති ආධාර සංවිධානද තිබේ. තමා නියෝජනය කරනු සඳහා නීතිඥයකු යොදා ගැනීමට අපොහොසත් අයට උපකාරී වීමට මෙන්ම දේශීය ප්‍රජාවට අධ්‍යාපනික සේවය සඳහාද රජය, ප්‍රජා නීති ආධාර මධ්‍යස්ථාන 11 ක් පවත්වයි. කෙසේ වුවද වසර අවසානය වන තෙක්ම නීති ආධාර මධ්‍යස්ථාන එකදු නඩුවක් හෝ විභාග කර නැත. ත්‍රස්ත ක්‍රියා වැලැක්වීමේ පනත යටතේ පවරනු ලබන නඩු වෙනුවෙන් ජූරි සභා සහභාගි නොවෙති. වධහිංසා පැමිණවීම් ඇතුළු හිරිහැර කිරීම් මත, බලෙන් ලබා ගන්නා පාපොච්චාරණ සාපරාධි නඩු විනිශ්චයේදී නොපිළිගනිතත්, ත්‍රස්තක්‍රියා වැලැක්වීමේ, පනත යටතේ පවරන නඩු සඳහා ඒවා උපයෝගී කරගනු ලැබේ.

තමාගෙන් පාපොච්චාරණ ලබා ගත්තේ බලපෑම් මත බව ඔප්පු කිරීමේ කාර්‍යභාරය නිරන්තරයෙන්ම

වූදිතයාට අයත් කායභාරයකි. ත්‍රස්ත ක්‍රියා වැලැක්වීමේ පනත යටතේ නඩු පවරනු ලබන වූදිතයන්ටද, අභියාචනා ඉදිරිපත් කිරීමට අවකාශ සලසා ඇත. ඇතැම් නඩු වලදී අධිකරණයේ සමාලෝචනයට යටත්ව. ස්වකීය නඩුව විසඳන තෙක් මාස 18 තෙක් කාල සීමාවකට සිරගතව සිටීමට, පරිපාලන නියෝග මත, ඇතැම් වගඋත්තර කරුවන්ට සිදුවේ. එවැනි අයවලුන්ට එරෙහි නඩු, විනිශ්චය කිරීම කඩිනමින් සිදු කෙරේ.

කොළඹ සහ දකුණේ විසිඳෙන නඩු බහුතරයක්ම සිංහලෙන් හෝ ඉංග්‍රීසියෙන් විසඳනු ලැබේ. එසේ කිරීමට හේතුව උසාවියෙන් පත් කරන භාෂා පරිවර්තකයන් හිඟවීම හේතුකොට ගෙන දෙමළ බස කථා කරන වගඋත්තරකරුවන්ට සිදු විය හැකි අසාධාරණය වලක්වා ලීමය. ඒ අතර උතුරේ නඩු විසඳනුයේ දෙමළ හෝ ඉංග්‍රීසි බසිනි. ත්‍රස්වාදයට සම්බන්ධ සෙසු නඩු, කොළඹදී විසඳීම සිරිතය. ද්‍රවිඩ භාෂාව කථා කරන, විනිසුරුවරයන් මහේස්ත්‍රාත් මට්ටමෙන් සිටින නමුත්, මහාධිකරණයේත් අභියාචනාධිකරණයේත් ඇත්තේ එවැනි විනිසුරුවරයන් 4 දෙනකු පමණි. නීතිය පිළිබඳ දෙමළ බසින් පළකර ඇති පෙළ පොත්ද ඇත්තේ ස්වල්පයකි. නීති වාර්තාද, එබසින් මෙතෙක් පළකර ඇත්තේ එකම වාර්තාවක්ය. ඒ අතර භාෂා තුනෙන්ම නීතියට අදාල, එවැනි ප්‍රකාශන නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු, දැනටමත් රජය අරඹා ඇත.

විවාහ වීමේ වයස් සීමාව, දික්කසාද වීම දේපල හිමිකම යනාදී ක්ෂෙත්‍රයන්හි කාන්තා පක්ෂයට අහිතකර අන්දමින් බලපෑ හැකි ඇතැම් පෞද්ගලික නීති එසේම පවත්වාගෙන යැමට රජය ඉඩදී තිබේ. (5 ඡේදය බලන්න)

යාපනයේ එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් උසාවි නිළධාරීන්ට එල්ල කරන ලද තර්ජන හේතුකොට, ගෙන මෑත අතීතයේ අධිකරණ කටයුතු අඩාල වූ අවස්ථා එමටය. ආරක්ෂක හේතු මත 2000 වසරේදී, යාපනයේ උසාවි කටයුතු අත්හිටවූ නමුත්, 2001 වසරේදී එය යළිදු ක්‍රියාත්මක වූ අතර, මේතාක් අඛණ්ඩව කටයුතු කරනු ලැබේ. උතුරු නැගෙනහිර ප්‍රදේශවල කලින් රජයේ අධිකරණ බල ප්‍රදේශයන් වශයෙන් පැවති පළාත් වලටද, මෙම වසර තුළදී එල්.ටී.ටී.ඊ සංවිධානය ස්වකීය අධිකරණ කටයුතු ව්‍යාප්ත කරන්නට යෙදුණි. එම බලප්‍රදේශ ව්‍යාප්තියත් සමගම, එල්.ටී.ටී.ඊ අධිකරණ ක්‍රමයට අනුගත වන ලෙසත්, රජයේ අධිකරණ ක්‍රමයෙන් බැහැර වන ලෙසත්, එල්.ටී.ටී.ඊ සංවිධානය නියෝග කළේය. එම නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා එල්.ටී.ටී.ඊ සංවිධානය, බලය හා තර්ජනය උපයෝගී කර ගත් බවටද වාර්තා ලැබී ඇත.

එල්.ටී.ටී.ඊ සංවිධානයට, ඒ අනුව තමන්ගේම අධිකරන නීති පද්ධතියක් ඇති නමුත්, ඔවුන්ගේ විනිසුරුවරයන්ට ඇතැම් විට නීතිය පිළිබඳ සුළු දැනුමක් තිබිය හැකිය. ඇතැම් විට කිසිදු දැනුමක් නැත. එල්.ටී.ටී.ඊ අධිකරණ ක්‍රමය ක්‍රියාත්මක වන්නේ කිසිදු නිශ්චිත බල අධිකාරියකින් හෝ රහස්‍ය බව රැකීමේ විධිමත් සංකේතාශ්‍රිත ක්‍රම වේදයකින් හෝ තොරවය. එය ඇත්ත වශයෙන්ම එල්.ටී.ටී.ඊ නියෝජිතායතනයක් හැර, නිදහස් ස්වාධීන අධිකරණ පද්ධතියක් නොවේ. දැන ගන්නට ලැබී ඇති ආකාරයට එම උසාවි මගින් මරණීය දණ්ඩනයද ඇතුළු දැඩි දඬුවම් පමුනුවා තිබේ.

ත්‍රස්ත ක්‍රියා වැලැක්වීමේ පනත යටතේ රඳවා ගෙන සිටින සෑම පුද්ගලයකුම, එල්.ටී.ටී.ඊ සංවිධානයේ

සාමාජිකයකු බවට සැක කරනු ලබන බවත්, එබැවින්ම ඔවුන් රටේ ආරක්‍ෂාවට තර්ජනයක් බවත් රජය කියා සිටී. එම රැඳවියන් ඇත්ත වශයෙන්ම දේශපාලන සිරකරුවන් දැයි නිශ්වය කිරීමට අවශ්‍ය සාධක ප්‍රමාණවත්ව නොලැබිණි. එම පුද්ගලයන්ට එරෙහිව ඉදිරිපත් කරනු ලබන චෝදනා බොහොමයක සුජාතබව පිළිබඳව බොහෝවිට මානව හිමිකම් සංවිධාන ප්‍රශ්නකර ඇත. 2002 වසරේදී එවැනි චෝදනා 750 කට අධික සංඛ්‍යාවක් නිතිපති විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය. ත්‍රස්ත ක්‍රියා වැලැක්වීමේ පනත යටතේ චෝදනා ලත් ද්‍රවිඩ ජාතිකයන් 65 ක්, අදාල වර්ෂය ඇතුලත රැඳවුම් කඳවුරුවල රැඳී සිටියහ. දැනට ඉතිරිව ඇති සෙසු නඩු, මරාගෙන මැරෙන බෝම්බ පිපිරවීමේ හෝ වෙනත් ත්‍රස්ත ක්‍රියා හෝ සාපරාදි ක්‍රියාවලට එකඑල්ලේ සම්බන්ධ වුවන්ට එරෙහිව පවරා ඇති ඒවා බව රජය කියයි.

එල්.ටී.ටී.ඊ සංවිධානයද සාපේක්ෂිත වශයෙන් සිරකරුවන් සැහෙන ප්‍රමාණයක් රඳවාගෙන සිටි බව කියනු ලැබේ. සංවිධානයේ රහස්‍යභාවය හේතු කොට ගෙන ඔවුන් රඳවාගෙන සිටි සිරකරුවන්ගේ සංඛ්‍යාව නිශ්චිතව දැන ගැනිම අසීරුය. එපමණක්ද නොව ජාත්‍යන්තර රතු කුරුස හමුදාවේ පරීක්ෂණයකට පවා ඔවුහු නිසි ඉඩකඩ නොසලසන්හුය.

**එෆ්. පවුල් සංස්ථාවේ නිවසේ හෝ පෞද්ගලික ලිපි ලේඛන වල රහස්‍ය භාවයට අනිසි අන්දමින් මැදිහත් විම**

පුද්ගලයාගේ පෞද්ගලිකත්වය හා බැඳුණු රහස්‍ය භාවය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිළිගෙන ඇත. එහෙත් ඇතැම් අවස්ථාවලදී රජය, ප්‍රයෝගික මට්ටමින් අනවශ්‍ය සේ එයට මැදිහත් වූ අවස්ථා ගැන දැනගන්නට තිබේ. සාමාන්‍ය නීතිය යටතේ අත්අඩංගුවට ගැනිමේදී හෝ සෝදිසි මෙහෙයුම් කිරීමේදී හෝ ඒ සඳහා බලපත්‍රයක් ලබා ගැනිම සාමාන්‍ය නීතිය යටතේ කරනු ලැබේ. එහෙත් දැනට නිෂ්ප්‍රභා වී ඇති හදිසි නීතිය යටතේ හෝ ත්‍රස්ත ක්‍රියා වැලැක්වීමේ පනත යටතේ හෝ කරන මෙහෙයුම් සඳහා එවැනි සෝදිසි බලපත්‍රයක් අවශ්‍ය නොවේ. එවැනි සෝදිසි කිරීම් සඳහා අවකාශ සැලසීමේ බලධාරියා ආරක්‍ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාය. කිසියම් පදනමක් මත තෝරා ගන්නා අයවලුන්ගේ දුරකථන සාකච්ජා සහ ලිපි ලේඛන රජයේ නිරීක්ෂණයට යටත් කර ඇති බව පැවසේ. එහෙත් එවැනි නිරීක්‍ෂණ ආරක්‍ෂක හමුදා විසින් වසර ඇතුළත කර ඇති බවට වාර්තා ලැබී නැත.

2002 සැප්තැම්බර් මාසයේදී එල්.ටී.ටී.ඊ සංවිධානයට පවරා තිබුණු තහනම රජය ඉවත් කළේය. ඉන් අදහස් වුයේ හුදෙක් එම සංවිධානය සමඟ ඇති සම්බන්ධතාවය මත ඔවුන් සිරභාරයට නොගන්නා බවය.

අතිශයින්ම කාර්‍යක්‍ෂම තොරතුරු ජාලයක් මගින්, පුරවැසියන්ගේ රහස්‍ය බවට අදාල ක්‍ෂෙත්‍රය ආක්‍රමණය කිරීමට, එල්.ටී.ටී.ඊ සංවිධානය ඒ අතර ක්‍රියා කළේය. වර්ෂය ඇතුළත එල්.ටී.ටී.ඊ සංවිධානය ස්වකීය යුද කටයුතු සඳහා බලෙන් ළමයින් බඳවා ගත්තේය. (6සී බලන්න.) කෙසේ වුවද වසර තුළදී එම සංවිධානය එසේ බඳවා ගත් ළමයින් 141 දෙනකු මුදා හැර තිබේ. 2002 වසරේදී තවදුරටත් ළමුන් 85 ක් මුදා හරිමින් එල්.ටී.ටී.ඊ සංවිධානය කියා සිටියේ, ඔවුන් සිය කැමැත්තෙන්ම තම සංවිධානයට බැදුනු බවත් තමන් එය ප්‍රතික්ෂේප කරමින් එසේ ළමයින් ආපසු හරවා යවන බවත්ය. (6සී බලන්න) එල්.ටී.ටී.ඊ සංවිධානය මුස්ලිම්

ජාතිකයන් පළවා හැරි බවත් එම වසරේ වාර්තා වී නැත.

**ජී. ආභ්‍යන්තරික හා බාහිර ගැටීම් වලදී දැඩිසේ බලය පාවිච්චි කිරීම් සහ මානව හිමිකම් උල්ලංඝණය කිරීම්**

2001 දෙසැම්බර් මාසයේ ප්‍රකාශයට පත්, ඒකපාක්ෂික සටන් විරාම ගිවිසුමට පසුව, 2002 පෙබරවාරි මාසයේ අත්සන් කරන ලද සාම ගිවිසුමට අනුව, රජය හා එල්.ටී.ටී.ඊ සංවිධානය අතර ගැටීම් අඩු විය. ඉන් පසුව දෙපක්‍ෂයම වරින් වර සිරකරුවන් මුදා හැරිය අතර, යාපනයට ප්‍රවිෂ්ඨ වන ප්‍රධාන මාර්ගයද විවෘත කරන ලදි. විරුද්ධවාදිකම් අඩුවීම නිසා රට වටා තිබුණු මාර්ග බාධක සහ පිරික්සුම් කපොලු අඩුවූ අතර, උන්හිටි තැන් අහිමි වුවන් දළ වශයෙන් 341,000 ක් පමණ, උතුරේ සහ නැගෙනහිර ස්වකීය මුල් වාසභූමි කරා පැමිණියහ. එසේම ආරක්‍ෂක හමුදා එතෙක් කළ, සෝදිසි මෙහෙයුම්ද සාපේක්ෂව අවම විය.

2002 අප්‍රේල් මාසයේදී නිලාවෙලි ප්‍රදේශයේදී නාවික භටයන් විසින් වෙඩි තබනු ලැබීමෙන්, කාන්තාවන් දෙදෙනෙක් තුවාල ලැබුහ. එම සිද්ධියට හේතු වූ කරුණු මෙතෙක් නිශ්චිතව නිරීක්ෂණය වී නැති අතර, වසර අවසාන වනතෙක්ම ඒ පිළිබඳ පරීක්‍ෂණ අවසන් නොවිනි.

2001 වසරේදී යුද හමුදාව විසින් මානව හිමිකම් සහ මානව හිතවාදී නීති පාලනාධිකාරිය, පිහිටුවන ලදි. ජාත්‍යන්තර රතු කුරුස හමුදාව විසින් දෙනු ලබන පුහුණුවකින් පසුව, මානව හිමිකම් පිළිබඳ සියලු කටයුතු කිරීමටත්, රටපුරා රැඳවුම් කඳවුරු පරීක්‍ෂාවටත්, එම පාලනාධිකාරියට සිදු විය. (4වන ජේදය බලන්න) ජාත්‍යන්තර නීතියට අදාලව සමස්ත පුහුණුව, යුද හමුදාවේ සියලු දෙනාට මනාව ලැබී ඇති බවත්, ජාත්‍යන්තර මානව හිමිකම් වලට අනුකූලව කටයුතු කරන බවටත්, යුද හමුදාව ප්‍රකාශ කළේය. 2002 වසරේදී ගුවන් හමුදාව සහ නාවික හමුදාවද, එයට සමාන වැඩ සටහන් දියත් කළහ. සිවිල් වැසියන් සිටින ප්‍රදේශවල වෙඩි තැබීම්, බෝම්බ පිපිරවීම් සීමා කෙරෙන ලිඛිත නීති යටතේ සන්නද්ධ හමුදා ක්‍රියා කළේය. වර්ෂය ඇතුළත යුද හමුදාව තවදුරටත්, මානව හිමිකම් සඳහා අත්‍යාවශ්‍ය අන්දමේ අභ්‍යාස වැඩ සටහන් තම නිළධාරීන් සහ රාජකාරියේ නියුක්ත සෙසු අය සඳහාද ආරම්භ කෙළේය.

එල්.ටී.ටී.ඊ පාලනයට යටත් ප්‍රදේශ වල සිටින පවුල්ද ඇතුළු, සරනාගත පවුල් සඳහා, අත්‍යවශ්‍ය සේවා මහ කොමසාරිස් මගින් සහ විවිධ සේවා සමුපකාර සමිති මගින් සහන සැලසීමට රජය ක්‍රියා කෙළේය. එම ආහාර තොග රජය විසින් යාපනයේ එල්.ටී.ටී.ඊ පාලන ප්‍රදේශයක් වූ උතුරේ, වන්නියට ප්‍රවාහනය කළේ එක් කෙළවරක් ශ්‍රී ලංකා හමුදාව විසින්ද අනෙක් කෙළවර එල්.ටී.ටී.ඊ සංවිධානය විසින්ද පාලනය කරන පරීක්ෂණ කපොලු දෙකක් හරහාය. එහෙත් මෙම වසරේදී වන්නි ප්‍රදේශයට ඇතුල් වන සීමාවේ පරීක්ෂණ කපොලු විවෘතව තිබිනි. කලින් අවස්ථා වලදීට වඩා ඒ නිසා, පහසුවෙන් එම ප්‍රදේශ කරා ඇතුල් වීමට, ආධාර ගෙන ගිය රජයේ නොවන සංවිධානවලට අවකාශ ලැබිනි.

සන්නද්ධ එල්.ටී.ටී.ඊ සාමාජිකයන් කිහිප දෙනකුම රජයේ පාලන ප්‍රදේශ තුලදී රජය විසින් 2002

වසරේදී අත්අඩංගුවට ගනු ලැබිය. එය සටන් විරාම ගිවිසුමට පටහැනිය. රජය එවැනි එල්.ටී.ටී.ඊ සාමාජිකයන් ආසන්නතමව පිහිටි එල්.ටී.ටී.ඊ පරීක්ෂණ කපොල්ල වෙත යැවීම සාමාන්‍ය සිරිත බවට, වාර්තා වී ඇත. එහෙත් ඇතැම් අවස්ථා වලදී එසේ ඉක්මණින් ආපසු නොයවා කලක් රඳවා ගැනීම්ද සිදුවිය. කලින් යුදහමුදාව කළේ තම අත්අඩංගුවට ගත් එල්.ටී.ටී.ඊ නියෝජිතයන් සහ පැමිණ භාරවූ නියෝජිතයන් යන දෙපක්ෂයම පුනරුත්ථාපන කඳවුරු වලට යැවීමය. රජයේ කඳවුරුවල කලින් රඳවා සිටි එල්.ටී.ටී.ඊ රැඳවියන් බැලීමට ජාත්‍යන්තර රතු කුරුස හමුදාව ඒ ස්ථානවලට නොකඩවාම ගියේය. 2000 වසරේදී බණ්ඩාරවෙල. බිඳුනු වැව පුනරුත්ථාපන කඳවුරේදී රැඳවියන් 20 දෙනකු මරා දැමීම නිසා, එවැනි කඳවුරු තුළ ඇති ආරක්ෂව පිළිබඳව සොයා බැලීමට නිරීක්ෂකයන්ට සිදුවිය. (1-ඒ සහ 1-ජී බලන්න)

ගතවූ වසරේ විරුද්ධවාදීකම් අඩුවූ බැවින්ද, එල්.ටී.ටී.ඊ සාමාජිකයන් විශාල පරිමාණයෙන් තුවාල ලැබූ බැවින්ද, සටන් බිමේදී අත්අඩංගුවට ගන්නා එල්.ටී.ටී.ඊ සාමාජිකයන්ගේ සංඛ්‍යාව ක්‍රමයෙන් අඩුවිය. හමුදාව විසින් සිරභාරයට ගත් එල්.ටී.ටී.ඊ රැඳවියන්ට වඩා වැඩි ප්‍රමාණයක් මරා දමන්නට ඇතියි නිරීක්ෂකයෝ අනුමාන කළහ. “සිරකරුවන් ගතයුතු නැත”, යන ලේඛණගත නොකළ රජයේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන්නට ඇති බවක්ද ඇතැම් නිරීක්ෂකයන්ගේ මතය විය. රජය එම චෝදනාව ප්‍රතික්ෂේප කරයි. එල්.ටී.ටී.ඊ ය බොහෝ විට තුවාල ලැබූ සිරකරුවන් සටන් බිමේදීම රැගෙන යාම, සතුරාට හසුවූ සටන්කාමීන් සියදිවි නසා ගැනීමට දක්වන වැඩි කැමැත්ත, තම පක්ෂයේ සටන්කරුවන් දැඩිසේ තුවාල ලැබූවිට ඔවුන් මරා දැමීමේ එල්.ටී.ටී.ඊ පිළිවෙත යනාදී සිරකරුවන්ගේ අඩුවීමට හේතු වශයෙන් රජය ගෙනෙන තර්කය වී තිබේ. වර්ෂය ඇතුළතදී රජය එල්.ටී.ටී.ඊ සාමාජිකයන් මරා දැමූ බවට වාර්තා වි නැත.

රජයේ භාරයට ගනු ලැබූ එල්.ටී.ටී.ඊ සටන්කරුවන්ට වෛද්‍ය පහසුකම් තම ආයතන විසින්ම, සැලසීමට ගතවූ වර්ෂ කිහිපය තුළ, සහන සංවිධාන යෝජනා කළ නමුත් රජය එම ඉල්ලීම ප්‍රතික්ෂේප කෙළේය. එවැනි තුවාල ලැබූවන්ට රජය අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සලසා දුන් බවට වාර්තා ලැබී තිබේ.

කලින් අවස්ථා බොහොමයකදීම තමන් රජයේ සෙබලුන් හිරභාරයට ගත් පිරිසට වඩා වැඩි පිරිසක් මරා දැමූබව එල්.ටී.ටී.ඊ ය පිළිගනී. එපමණක්ද නොව සටන් බිමේදී තුවාල ලැබූ සෙබලුන් පවා එල්.ටී.ටී.ඊ ය විසින් මරා දමනු ලැබූ බවට ඇසින් දුටු සාක්ෂිද තිබේ. වසර අවසානයේ නම් එල්.ටී.ටී.ඊ ය තමන් රඳවාගෙන සිටි හමුදා සෙබලුන් සැවොම නිදහස් කළ බව කියනු ලැබේ. එහෙත් ගතවූ වර්ෂය කිහිපය තුළ එල්.ටී.ටී.ඊ විසින් සිරභාරයට ගත් පොලිස් නිලධාරීන් සහ ආරක්ෂක හමුදා භටයන් බහුතරයක්ම ඝාතනය කළ බව විශ්වාස කළ හැකිය.

සටන්වලදී සිවිල් වැසියන්ද ඉලක්ක කර ගනිමින් එල්.ටී.ටී.ඊය, පුළුල් පරිමාණයෙන් සටන්කාමීන් යොදවා තිබේ. සටන් විරාමයෙන් පසුව එල්.ටී.ටී.ඊ සංවිධානය, මිනිසුන් පැහැරගෙන යාම, රථවාහන, නැව්ගත භාණ්ඩ බලෙන් අත්පත් කර ගැනීම, කුඩා ළමයින් ඇතුලු බොහෝ දෙනා බලෙන් බඳවා ගැනීම යනාදී ක්‍රියාවල නිරත වී ඇත. අදාල වර්ෂය ඇතුළත එල්.ටී.ටී.ඊ ය බඳවා ගැනීම් ප්‍රමාණය සීඝ්‍රයෙන් වැඩිකර තිබේ. ඒ අතර වයස 13-17 අතර ළමුන් එල්.ටී.ටී.ඊ කඳවුරුවලින් මිදී, නිදහස සොයා ගිය අවස්ථා ගැනද ඉඳසිට වාර්තා

ලැබිණි. අදාල වර්ෂය තුළ, එල්.ටී.ටී.ඊ කඳවුරුවලින් මුදා හැර ඇති ළමුන් සංඛ්‍යාව 141 කි. (1එෆ් සහ 5 බලන්න) එම වර්ෂය ඇතුලත එල්.ටී.ටී.ඊය, ළමුන් පැහැරගෙන යාම් කළ බවට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව 200 ක් පමණ විය. එසේ පැහැර ගත් ළමුන්, ළමා සොල්දාදුවන් වශයෙන් යොදා ගත් බවට වාර්තා ලැබී ඇති බවද ශ්‍රී ලංකා නිරීක්‍ෂණ කණ්ඩායම (□□□□) වාර්තා කර තිබේ. එල්.ටී.ටී.ඊ සංවිධානයේ ජ්‍යෙෂ්ඨ නිළධාරීන් කීවේ ළමයින් සිය කැමැත්තෙන් පැමිණි බවය. අදාල වර්ෂයේදී එල්.ටී.ටී.ඊ ය එක්සත් ජාතීන්ගේ ළමා සංවිධානය (□□□□□□) සමග ගිවිසුමකට එළඹියේය. ඒ අනුව ළමා සොල්දාදුවන් මුදා හැර ඔවුන් පුනරුත්ථාපනය කිරීමටත් ළමා ශ්‍රමය හා  බාලවයස් කරුවන් බඳවා ගැනීම, යනාදිය නවතාලීමටත් යුනිසෙෆ් ආයතන ක්‍රියා කළ අතර ඒ පිළිබඳව වැඩසටහනක්ද ආරම්භ කෙළේය. කෙසේ වුවද එල්.ටී.ටී.ඊ ය එම සැලැස්ම අඛණ්ඩව ගෙනයාමට අපොහොසත් විය.

එල්.ටී.ටී.ඊ සංවිධානයේ පාලනයට යටත් ප්‍රදේශ වල සිටින උන්හිටි තැන් අහිමි සරණාගතයන් සඳහා යවනු ලැබූ ආහාර, ඉන්ධන සහ වෙනත් ද්‍රව්‍ය අතරමගදී උදුරා ගැනීමෙන් එම සංවිධානය සරණාගතයන්ගේ තත්වය තවදුරටත් ශෝචනීය තත්වයකට ගෙන ආවේය. පෝෂණ මට්ටම සාමාන්‍ය මට්ටමටද වඩා පහත වැටීම හේතුකොට ගෙන එල්.ටී.ටී.ඊ පාලනයට යටත් ප්‍රදේශවල පමණක් නොව, වන්නියේ සෙසු පෙදෙස්වල පවා අවපෝෂණය බැරෑරුම් ප්‍රශ්නයක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ලේ අඩුකම සහ උපත් සංඛ්‍යා පහළ වැටීම සිදුවූ බව විශේෂඥ මතය විය. සිය ගණන් ළමෝ ඌනපෝෂණයට ගොදුරු වූහ.

යාපනයේත් වන්නි ප්‍රදේශයේත්, තරමක් දුරට නැගෙනහිර ප්‍රදේශය තුළත්, බිම් බෝම්බ සෑහෙන ප්‍රශ්නයකි. (5 කොටස බලන්න) අවතැන් වුවන් යලි පදිංචි කරලීමේදී  බිම් බෝම්බ, මර උගුල් වෙනත් පුපුරන ද්‍රව්‍ය යනාදිය පුනරුත්ථාපනයට විශාල බාධකයක් විය. 2002 වසර අවසාන වෙද්දී, බිම් බෝම්බ වැළලූ ප්‍රදේශ, සිතියම් ගත කිරීමේ වැඩ පිළිවෙලක් ඇරඹූ එක්සත් ජාතීන්ගේ කණ්ඩායමක්, ඒවා ඉවත් කිරීමට කටයුතු ඇරඹූහ. එම වසර තුලදී යටොක්ත එක්සත් ජාතීන්ගේ කණ්ඩායම බිම් බෝම්බ ඇති ප්‍රදේශවල සිතියම් පරිගණක ගත කර ඒ බිම් බෝම්බ ඉවත් කිරීමේ නියුක්ත මේ රටේ සිටින සෙසු නියෝජිතයන් 12 සමඟ සුසංයෝගි විය. වසර ඇතුළත එල්.ටී.ටී.ඊය මෙන්ම රජයද ස්වකීය පාලනයට නතු පෙදෙස්වල බිම් බෝම්බ ඉවත් කළේය එක් මසක් තුල බිම් බෝම්බ වලින් තුවාල වුවන් 15 ක් පමණ සිටි බව රජය වාර්තා කළේය.

## 2 කොටස
## සිවිල් නිදහසට ගරු කිරීම ඇතුළුව

### ඒ : මුද්‍රිත මාධ්‍ය නිදහස

කථා කිරීමේ නිදහසට සහ අදහස් පළ කිරීම් නිදහසට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉඩකඩ සලසා තිබේ. එබැවින් රජය ක්‍රියාත්මක වශයෙන් එයට සැලකිල්ලක් දක්වයි. ජාතික ආරක්‍ෂාව පිළිබඳ නීති රීති මුවාවෙන් යටොක්ත අයිතිවාසිකම් සීමා කිරීමට රජය කලින් අවස්ථා වලදී ක්‍රියා කළේය. නිදහස් මාධ්‍ය බිය ගැන්වීමට, රජය කලින් පාවිච්චි කළ, සාපරාධි ලෙස අපහස කිරීම පිළිබඳ නීතිය, 2002 වසරේදී ඉවත් කෙරිණි. යුද තොරතුරු වාර්තා කිරීම සීමා කරමින් පැවැති නියමයන් 2001 වසරේ සිට නිල වශයෙන්ම ඉවත් කරන ලදි.

රජය විසින් සීමා පනවා නැති අවස්ථා වලදීත්, ඇතැම් පෞද්ගලික රූපවාහිනි මධ්‍යස්ථ ජාත්‍යන්තර රූපවාහිනි පුවත් නැවත ප්‍රචාරය කිරීමේදී අනියම් සීමා තමන් විසින්ම පමුණුවා ගත් අවස්ථාද ඇත.

අති විශාල පුවත්පත් සමූදායක් රූපවාහිනි මධ්‍යස්ථාන දෙකක් සහ ගුවන් විදුලි මධ්‍යස්ථානයක්ද, රජය සතුව තිබුණද විවිධ වූ පෞද්ගලික මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය යනාදිය වඩාත් ප්‍රබලව ක්‍රියා කරති. ඒවා මගින් නිදහසේ රජය විවේචනයට ලක් කරන නමුත් තවදුරටත් පිහිටුවනු ලබන  නව මාධ්‍ය ව්‍යාපෘති වලට හෝ රජය සීමා පැනවීමක් නොකරයි.

විදේශ මාධ්‍යකරුවන්ට විරුද්ධව පවරා තිබූ සීමාවන්, 2000 වසරේ නිකුත් කළ චක්‍රලේඛයක් මගින්, ජනාධිපතිනිය විසින් ලිහිල් කරනු ලැබිණි. එහෙත් රට තුල පළ කැරෙන මාධ්‍ය තොරතුරු සම්බන්ධයෙන් රජයේ අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාව, පුවත් වාරන පනත 2001 වසරේදී ඉවත් කර ගන්නා තෙක්ම, ක්‍රියාත්මක විය. පෞද්ගලික මාධ්‍ය ආයතන වලට එරෙහි තර්ජන හා බිය ගැන්වීමේද ඒ සමඟ අඩුවනු දක්නට ලැබිණි.

අදාල වර්ෂයේ මැයි මස 7 වන දින එල්.ටී.ටී.ඊ නායක සමඟ සම්මුඛ සාකච්ඡාවක් සිදුකල  බී.බී.සී පුවත් නිවේදක පොන්නයියා මැණික්කවාසගම්ට. එල්.ටී.ටී.ඊය පිලිබඳව වාර්තා කිරීම නිසා මරණීය තර්ජන එල්ල වීම සම්බන්ධයෙන්, ජනාධිපතිනියටත් අගමැතිවරයාටත් ජගත් ප්‍රංශ පුවත් සේවය පැමිණිලි කෙළේය. එම තර්ජනය පිටුපස රජයට පක්ෂව ක්‍රියා කරන ඊ.පී.ඩී.පී. පක්ෂය සිටින බවට එම පුවත් සේවය සැක කළේය. ඊට දින 2 කට පසුව සිංහල ජාතික පත්‍රකලාවේදීන් දෙදෙනකුට, වව්නියාවේදී එල්.ටී.ටී.ඊ සාමාජිකයෝ තර්ජනය කළහ. වව්නියාව මානික්කවාසගම්ගේ නිජබිමය. ඔක්තෝම්බර් 12 දා මනිපායි සහ නෙල්ලිඅඩි ප්‍රදේශයන්හිදී මාධ්‍යවේදීන් සිව් දෙනකුට යුද හමුදාව කළ පහර දීමක් හේතුකොට ගෙන යාපනේ මාධ්‍යවේදීන් වැඩ වර්ජනයක යෙදුන බව, රතු කුරුස හමුදාව වාර්තා කර ඇත.

2002 වසරේදී අපහාස කිරීම පිළිබඳ නීති අවලංගු කළ බැවින්, එයට අදාල අධිකරණ ක්‍රියා මාර්ගද නවතාලන ලදී.

රජයේ ආරක්ෂක හමුදාවත් ද්‍රවිඩ ජාතික පාර්ලිමේන්තු කණ්ඩායමක් තමන්ට තර්ජන හා බිය ගැන්වීම් කරන බව පවසමින් 1999 වසරේදී, ද්‍රවිඩ මාධ්‍යවේදීන් ශ්‍රී ලංකා ද්‍රවිඩ මාධ්‍ය සන්ධානයක් (□□□□□) පිහිටුවිය. නීති විරෝධී අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන්ද, එම කලාපයේ මාධ්‍යවේදීහු පැමිණිලි කළහ. ඔවුන් ඒ පිළිබඳ අධිකරණයේ නඩු පවරා තිබුණද එම ක්‍රියා මාර්ගය සාර්ථක නොවිණි.

මාධ්‍ය ප්‍රකාශන මධ්‍යස්ථාන වලට එරෙහි, පැමිණිලි ඉදිරිපත් කිරීම ජනතාවට පහසු කරනු සඳහා මාධ්‍ය පැමිණිලි කොමිසමක්ද, වර්ෂය තුළදී ස්ථාපිත කරන ලදී. නොවැම්බර් මාසයේදී කාර්‍යාරම්භ කළ එම කොමිසම, පැමිණිලි විභාග කිරීම ඇරඹීය.

ගතවූ වර්ෂවලදී මෙන් එම වසෙර්දීත් දේශිය හා විදේශිය මාධ්‍යවේදීන්, සටන් පවතින ප්‍රදේශ කරා යාමේදී තහනමක් දක්නට නොලැබිනි. එල්.ටී.ටී.ඊ සංවිධානය කිසිසේත්ම මාධ්‍ය නිදහසට එකඟ නොවිය. ඔවුන් කෙළේ, තම බලප්‍රදේශ තුළ මුද්‍රිත හා ගුවන් විදුලි ප්‍රකාශන තදින්ම පාලනය කිරීමය. ද්‍රවිඩ භාෂාමය සති අන්ත පුවත් පතක් වූ තිනමුරුසු පත්‍රය බෙදා හරිමින් ගමන් කළ රථයකට, සැඟවී සිට පහර දුන් මඩකලපුවේ එල්.ටී.ටී.ඊ සටන්කමීහු පුවත්පත් 50 ක් අගෝස්තු 7 දා ගිනි බත් කළහ. මානව හිමිකම් වාර්තා කරන්නවුන් මරා දැමීමට පවා, එල්.ටී.ටී.ඊය එයට කලින් පෙළඹුන බව වාර්තාගතය.

2002 වසරේ ගුවන් හමුදා නිළධාරීන්, දෙදෙනකු ආරක්ෂක කටයුතු වාර්තා කළ මාධ්‍යවේදියකුගේ නිවසට කඩා වැදී තර්ජනය කිරීමේ වරදට එම නිළධාරීහු දඬුවම් ලැබූහ. එහෙත් ඔවුන් ඇප ලබා ගෙන අභියාචනා ඉදිරිපත් කළහ.

රජය විසින් අන්තර්ජාල පහසුකම් සීමා කිරීමක් හෝ දැනුම ලැබීම සීමා කිරීමක් හෝ කරනු ලැබ නැත.

ඒ අතර එල්.ටී.ටී.ඊ සංවිධානය දැනුම ලැබීම සීමා කළේය. ඔවුහු බුද්ධිමතුන් මැඩලීමෙහිත් ඝාතනය කිරීමෙහිත් යෙදුනාහ. මානව හිමිකම් සුරැකීමේ විශ්ව විද්‍යාල ගුරුවරුන් වැනි අයවලුන් මර්ධනය කළහ. ඇතැමෙකු මරා දැමූහ. තවත් කොටසක් මේ වෙනතෙක් වසන් වී සිටී.

### බී. සාමකාමී රංචු ගැසීම් හා සමිති සමාගම් පැවැත්වීමේ නිදහස

සාමාකමී රංචු ගැසීම් සහ සමිති සමාගම් පැවැත්වීමේ නිදහසට නීතියෙන් ඉඩ සලසා ඇතිවා පමණක් නොව රජය එම අවශ්‍යතා ගරුකරන බවද පැහැදිලිය. ත්‍රස්ත ක්‍රියා වැලැක්වීමේ පනත යටතේ ඉහත කී නිදහස සීමාකළ හැකිව තිබුණද රජය එසේ නොකළේය. සාමකාමී දේශපාලන රැස්වීම් මෙන්ම වෙනත් විවිධ රැස්වීම්ද වසර තුළ බෙහෙවින් පවත්වනු ලැබිණි.

ජනමත විමසුමක් පවතින කාලය තුළදී දේශපාලන මුහුණුවරක් ගත් රැස්වීම්, ජනරැළි යනාදිය නොපැවැත්විය යුතු බව 1981 ජනමත විමසුම් පනතේ සඳහන්ව තිබේ. කෙසේ වෙතත් විරුද්ධ පක්‍ෂයේ රැස්වීම් සහ කුඩා කණ්ඩායම් වල රැස්වීම් පවා පැවැත්වීමට හෝ විරෝධතා දියත් කිරීමට රජය අවසර දුන්නේය.

2002 වසරේදී අක්කරපත්තුවේ විරෝධතා ව්‍යාපාරයකදී පොලිස් විශේෂ කාර්‍ය බලකාය, ද්‍රවිඩ ජාතිකයන් අට දෙනකු මරා දැමීය. ඒ පිළිබඳ පරීක්ෂණ පැවැත්වූ පොලිසියත්, කොමිසමත් නිගමනය කෙළේ, එම පිරිස පොලිස් ස්ථානයට කඩා වැදීමට තැත් කළ බැවින් ආත්මාරක්ෂාව පතා වෙඩි තැබූ බවය. ද්‍රවිඩ ජාතිකයන් එය ප්‍රතික්ෂේප කළහ. ඔවුන් කියා සිටියේ තමන් සාමකාමී විරෝධය පලකළ බවය.

එල්.ටී.ටී.ඊ සංවිධානය බලප්‍රදේශ තුල එක්රැස් වීමේ නිදහස පාලනය කරයි. එම සංවිධානය ස්වකීය රැස්වීම්වලට ජනතාව බලෙන් ගෙන්වීමට කටයුතු කරයි. රජයේ ආයතන සහ ආරක්ෂක හමුදා නිළධාරීන් ඇසුරු කරන, දෙමළ ජාතික සිවිල් වැසියන්ගේ නම්, යාපන අර්ධද්වීපයේ ප්‍රසිද්ධ තැන්වල එල්.ටී.ටී.ඊ ය

ඉඳහිට ප්‍රදර්ශනය කරයි. යුද සමයේ ගිනිතබා විනාශ කළ යාපනයේ පුස්තකාලය, ප්‍රතිනිර්මාණය කර යලිත් විවෘත කිරීමට එම වසරේදී නියමිතව තිබුනද, එල්.ටී.ටී.ඊ ය එයට අවහිර කළේය. 1998 වසරේ නිදහස් වාතාවරණයක් යටතේ තෝරා ගනු ලැබූ දේශපාලන නායකත්වය යටතේ යාපනය ප්‍රදේශයේ සිවිල් පරිපාලනයක් ස්ථාපිත කිරීමට ක්‍රියා කළ ආරක්ෂක අංශ සමග සබඳකම් පැවැත්වූ, ද්‍රවිඩ සිවිල් වැසියන්ද එල්.ටී.ටී.ඊ ය මරා දැම්මේය.

## සී. ආගමික නිදහස

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බුදු දහමට සුවිශේෂ තැනක්දී ඇති අතර, සෙසු ආගම් අදහන්නන්ටද තම තමන්ගේ ආගම් සහ විශ්වාස නිදහසේ ඇදහීමේ අයිතියද තහවුරු කරනු ලැබ ඇත. බුදු දහමට විශේෂ මට්ටමකින් එසේ සැලකුවද, සෑම ආගමකටම අයත් ආගමික දිනයන් නිවාඩු දින වශයෙන් සලකා, උත්සව පැවැත්වීමටද අවකාශ සලසනු ලැබ ඇත.

විදේශීය ආගමික පූජකයන්ද දිවයින තුල ක්‍රියාත්මකව සිටිති. එහෙත් එවැනි කටයුතු සීමා කිරීම සඳහා රජය ඔවුන්ට බලපත් නිකුත් කරන්නේ කිසියම් සීමාවකට යටත්වය.

අවසර දීම සාමාන්‍යයෙන් සීමා කරන්නේ රජය යටතේ ලියාපදිංචි වී ඇති ආගමික කොටස්වලටය. ආගමික පූජක පිරිස් ස්ථිර පදනමක් මත රටට ඇතුළුවීම, රජය විසින් තහනම් කරනු ලැබ ඇත. එසේ ස්ථාවර මට්ටමකින් රැඳී සිටීමට අවකාශ ලබාදෙනුයේ දැනටමත් දිවයිනේ සිටින අයවලුන්ට පමණය.

වර්ෂය තුලදී කතෝලික හා ප්‍රොතෙස්තානු දේවස්ථාන කිහිපයකට අන්තවාදී භික්ෂූන්ගේ මෙහෙයවීමට බෞද්ධයන් විසින් පහරදෙනු ලැබූ බවට නිශ්චිත වාර්තා ලැබී තිබිනි. සතියට කිහිපයක් බැගින් එම පහරදීම් වල වැඩිවීමක් වසර අගදී දක්නට තිබූ බව කිතුනු සංවිධාන වාර්තා කර ඇත. ඒ පිළිබඳ පොලිසියට පැමිණිලි කළමුත්, බහුතර දේශීය පිරිසකගේ ආගමට ඇති ගෞරවය නිසා පොලිසිය පවා ඒ ගැන ක්‍රියාකිරීමට මැලිවී ඇත. කිසිවකු අත්අඩංගුවට ගැනීමක්ද වසර අවසන තෙක් සිදු නොවිනි.

ප්‍රස්තුත වර්ෂය තුලදී ආගමික කටයුතු විෂයෙහිලා, නෛතික ප්‍රවනතාවය සුවිශේෂ අවධානයට ලක් විය. ජූලි මාසයේදී කතෝලික කන්‍යා මව්වරුන් පිරිසකට, දිළිඳු ජනතාවට ඖෂධ සපයමින් පිලිසරණ වීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තහනම් කරන ලදී. එයට හේතු වශයෙන් දැක්වුයේ ඔවුන් එම සේවය කරන අතරතුර, එම ජනතාව තම ආගමට හරවා ගැනීමට, උත්සාහ දරන බවය. ජනවාරි මාසයේදී යලිදු ශ්‍රේෂ්ඨාධිකරණය "නිව් හාවෙස්ට් වයින් මිනිස්ට්‍රි", නැමැති එංගලන්ත සභාවේ ආගමික සංවිධානයට කටයුතු කිරීමේ අවසරය ප්‍රතික්ෂේප කළේය. සමාජ සේවය සමග ආගමික කටයුතු සමග පටලා නොගත යුතු බව එහිලා නිගමනයට එළඹි ශ්‍රේෂ්ඨාධිකරණ දැක්වූ හේතුව විය. හින්දු කටයුතු පිළිබඳ ඇමතිවරයා හින්දු බැතිමතුන් අන්‍යාගම් වලට හරවනු ලැබීමට එරෙහිව පනතක් ගෙනාවේද, එම කරුණ මතය. එම පනතට අනුව අන්‍යාගමකට හරවනු ලබන අයවලුන්ට එසේ කිරීමෙන් පසුව ඒ පිළිබඳ පලාත් අධිකාරියට දැන්විය යුතුය. ඒ සඳහා බලය පාවිච්චි

කළේද යනු, පරීක්‍ෂා කිරීමට ඉඩ සැලසීම එහි අරමුණය. එහෙත් එකී පනත වසර අවසාන වනතෙක් සම්මත නොවිනි.

2001 මුස්ලිම් ජාතික මුදල් අයකැමියකුට සිංහල ජාතිකයන් පිරිසක් පහර දුන්හ. පොලිසිය ඒ පිළිබඳ නිසි කටයුතු නොකළ විට මුස්ලිම් ජාතිකයෝ උද්ඝෝෂණ කළහ. ඉන්පසු දෙපක්‍ෂය යලිදු අරගලයක පැටලි මුස්ලිම් ජාතිකයන් දෙදෙනකු මරුමුවට පත්වූහ. වසර ඇතුලත කිසිවකු ඒ පිළිබඳව අත්අඩංගුවට නොගත් අතර, ඒ ඉදිරි ක්‍රියාමාර්ගයක්ද නොවිය.

උතුරේ එල්.ටී.ටී.ඊ සංවිධානය 1990 වසරේදී, එහි පදිංචිව සිටි මුස්ලිම් ජාතිකයන් පලවා හැරී බැවින් ඒ අයවලුන් සරණාගතයන් බවට පත්විය. ඒ අතරතුර එල්.ටී.ටී.ඊ නායකත්වය සාම වෑයම පිළිබඳව සාකච්ඡා කරනු සඳහා මුස්ලිම් නායකත්වය හමුවිය. මුස්ලිම් ජාතිකයන්ගේ නිවාස, ඉඩම් හා ව්‍යාපාර යනාදිය බිය ගන්වමින් පැහැර ගත්, ඔවුන් යලි තම ගම් බිම් බලා පැමිණියහොත් මරා දමන බවටත් එල්.ටී.ටී.ඊ සංවිධානය කලින් අවස්ථාවල තර්ජන එල්ල කර තිබිණි. පසුකලක තරමක් හෝ සාමකාමී පිලිවෙතක්, එල්.ටී.ටී.ඊ සංවිධානය ඉදිරිපත් කළද, මුස්ලිම් ජාතිකයන් තුළ ඔවුන් ගැන තිබුනේ දැඩි සැකයකි.

එපමණක්ද නොව නැගෙනහිර පළාතේද මුස්ලිම් ජාතිකයන්ට බිය වැද්දීම් තිබුණ අතර, එම දෙපක්‍ෂ අතර නිතර සුළු අරගලද තිබෙනු දක්නා ලදී. ත්‍රිකුණාමලයට නුදුරු මුතූර්හිදී එම වසරේ අප්‍රේල් 17-18 දින වල මුස්ලිම් ජාතිකයන් පස්දෙනකු මරා දමා තිබුණු අතර සටනේදී බොහෝදෙනා අවතැන් වූහ. අගෝස්තු මාසයේදී මුස්ලිම්වරුන් 5 දෙනකු මරාදැමූ අතර, මුස්ලිම් ව්‍යාපාරිකයන් සතු ව්‍යාපාරික ස්ථානද ගිනිබත් කරනු ලැබිය.

සතුරු බලපෑම් ඇති අවස්ථාවලදී සිවිල් වැසියන්ට ආරක්‍ෂාව සඳහා රැඳී සිටීමට නියම කර තිබුණු පන්සල් සහ දේවස්ථාන, පාවිච්චි කිරීම සම්බන්ධයෙන් එල්.ටී.ටී.ඊයට කොතෙකුත් දෝෂාරොපනය කරනු ලැබිය. වැඩි විස්තර සඳහා ජාත්‍යන්තර ආගමික නිදහස පිළිබඳ 2003 වාර්තාව බලන්න.

**ඩී. රට අභ්‍යන්තරයෙහි ගමනාගමනය විදේශ සංචාරය, විගමනය සහ පෙරලා සියරට පැමිණීම**

ගමනාගමන නිදහස, පදිංචියට සුදුසු ස්ථානයක් තෝරා ගැනීමේ නිදහස සහ යලිත් මව්බිමට පැමිණීමේ නිදහස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සෑම පුරවැසියකුටම ලබාදී තිබේ. එසේම ප්‍රයෝගික මට්ටමින් එම අවශ්‍යතාවය රජයේ ගෞරවයටද පාත්‍රවී ඇත. කෙසේ වුවද ගතවූ කාලය තුල එල්.ටී.ටී.ඊ ය සමග යුද ගැටීම් තිබුණු සමයේදී උතුරෙන් සහ නැගෙනහිරෙන් කොළඹට එන අයවලුන් පිළිබඳ විශේෂයෙන් රජය පරීක්ෂාකාරී විය. රාත්‍රී ගමන් ගන්නා එවැනි අය විශේෂ පරීක්ෂාවට ලක්විය. උතුරේත් නැගෙනහිරේත් ගමන් කිරීමේදී ද්‍රවිඩ ජාතිකයන් පොලිස් අවසර පත්‍රයක් ලබා ගත යුතුව තිබිණි. ඒ අතර දිවයිනේ විවිධ පලාත් වලදී පරීක්ෂා කිරීමේ කපොලු පසුකර යනවිට ඔවුන්ට කොතෙකුත් හිරිහැර වලට මුහුණපෑමටද සිදුවිය. එම සීමාකිරීම් නිසා ද්‍රවිඩ ජාතිකයන්ගේ ගමන් බිමන වල පාලනයක් විය.

2001 දී රජය, ගමන් බිමන් පිළිබඳ සීමා ඉවත් කරන්නට යෙදුනි. යුදහමුදා කඳවුරු අසල ප්‍රදේශ, ආරක්ෂක ප්‍රදේශ, හමුදා බැරැක්ක පිහිටි ස්ථාන ආදිය සිවිල් වැසියන් නොයායුතු ස්ථාන සේ සැලකිණි. ආරක්ෂක ප්‍රදේශ වශයෙන් හඳුන්වා ඇති ඇතැම් පෙදෙස් (විශේෂයෙන් යාපනයේ) තමන්ගේ කෘෂිකාර්මික ඉඩම් බව ද්‍රවිඩ ජාතිකයෝ කියා සිටියහ. ඒ අතර එල්.ටී.ටී.ඊ සංවිධානයද යාපනයත්, දිවයිනේ සෙසු ප්‍රදේශත් යා කෙරෙන මාර්ගයේ ගමන් බිමන් සීමා කළේය. එහෙත් 2002 වසරේදී රජය විසින් යාපනයට යාමට දමා තිබූ සීමා ඉවත් කරනු ලැබිය.

2001 අවසානයේ ශ්‍රී ලංකාවේ උන්හිටිතැන් අහිමිවූවන්ගේ සංඛ්‍යාව 800,000 ක් පමණ විය. සාම වැයමේ ආරම්භයෙන් පසුව, සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමසාරිස්වරයා ඉදිරිපත් කළ වාර්තාව අනුව එම සරණාගතයන්ගෙන් 341,000 ක් සිය නිජබිම් කරා යලිදු පැමිණ සිටි අතර, 500,000 පමණ අය එතෙර ගොස් තිබිණි. රතු කුරුස සංවිධානය වාර්තා කරන පරිදි, අධි ආරක්ෂක කලාපවල පිහිටීම හේතුකොට ගෙන 100,000 ක් පමණ සංඛ්‍යාවක් කිසිසේත්ම තම ප්‍රදේශවල පදිංචි කරවීමට නොහැකි විය. දකුණු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රදේශයේ අනාථ කඳවුරුවලද, 65,000 ක පමණ ද්‍රවිඩ ජාතික සරණාගතයන් රඳවා ඇත. ගතවූ වසර කිහිපය තුළ 100,000 ක පමණ පිරිසක් දකුණු ඉන්දියානු ද්‍රවිඩ ජාතිකයන් සමඟ ඒකාබද්ධ වන්නට ඇත. සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කියන පරිදි ඉන්දියාවේ සිට පෙරලා ශ්‍රී ලංකාවට පැමිණි පිරිස සුළුතරයක් විය හැකිය.

එල්.ටී.ටී.ඊ සංවිධානය, 1990 දී මුස්ලිම් ජනතාව 46,000 ක් පමණ ස්වකීය බලප්‍රදේශ වලින් නෙරපා හැරියේය. එසේ නෙරපා හැරි අයගෙන් බහුතරයක්ම ජීවත්වූයේ, සුභ සාධක මධ්‍යස්ථානවලය. මන්නාරම ප්‍රදේශයෙන් එසේ පළවා හරිනු ලැබූ මුස්ලිම් ජාතිකයන් දහස් ගණනකට, යලි මන්නාරමට නොඑන ලෙස එල්.ටී.ටී.ඊ ය තර්ජනය කර ඇති බව වාර්තාවී ඇත. දැන ගන්නට ඇති පරිදි එම පළවා හැරීම් සහ පහරදීම් වලට ප්‍රධාන හේතුව වී ඇත්තේ ආගම පිළිබඳ වෙනස නොවේ. ඊලමට පක්ෂපාත නොවන සියලුම ජනකොටස් ඉවත් කිරීමේ අරමුණය. එසේ උන්හිටිතැන් නැතිවූවන්ට යලිත් පැමිණෙන ලෙස එල්.ටී.ටී.ඊය පසුව දන්වා ඇති අතර හිරිහැර නොකරන බවටද පොරොන්දු විලු. ඇතැම් අය ආපසු පැමිණියද මුස්ලිම් ජාතිකයෝ බහුතරයක් පෙරළා පැමිණීමෙන් වැලකී සිටියහ. ඒ වෙනුවට ඔවුහු තවමත් ස්වකීය ආරක්ෂාව පිළිබඳ ස්ථිර සහතිකයක් රජයෙන් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් පසුවෙති.

වන්නි ප්‍රදේශයෙන් පිටවී යන අයවලුන්ට එල්.ටී.ටී.ඊය, ඉඳහිට පරීක්ෂණ කපොලු පසුකර යනවිට බාධා කරයි. ඒ තැන්වලදී සිවිල් වැසියන්ගෙන් බදු අය කිරීමද කරනු ලැබේ. උන්හිටිතැන් අහිමි වූ පිරිස් ත්‍රිකුණාමලේ සිට යාපනය බලා ගමන් කරන අවස්ථාවලදී, ඔවුන් පැහැර ගැනීමෙන් සහ පහරදීමෙන් එල්.ටී.ටී.ඊ සාමාජිකයන් අවහිර කළ බව කියනු ලැබේ. එහෙත් එවැනි වාර්තා අපට ලැබී නැත.

සරණාගත තත්වය යමෙකුට ප්‍රදානය කිරීමේදී එක්සත් ජාතීන්ගේ 1951 ප්‍රඥප්තියෙන් හෝ 1967 ගිවිසුමෙන් හෝ අපේක්ෂිත අර්ථකථනයට අනුව එම තත්වය දීමට අදාලව, නීතියෙන් විධි විධාන සපයා නැත. අවතැන්වූවන්ට සහ සරණාගතයන්ට සහාය වීමේදී ශ්‍රී ලංකා රජය වඩාත් සහයෝගයෙන් ක්‍රියා කරනුයේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් (□□□□□) සමග හෝ වෙනත් මානව සංවිධාන සමගය.

සරණාගතයින් පිළිබඳ ප්‍රශ්නය මෙම වසර තුලදී උද්ගත වී නොමැත. මෙරටින් පිටමන් කිරීමක්ද වාර්තා වී නොමැත.

**3 වන කොටස**

**දේශපාලන අයිතින්ට ගරු කිරීම : ස්වකීය රජය වෙනස් කිරීමේ පුරවැසි අයිතිය**

සාමකාමී අන්දමින්, පවත්නා රජයක්, වෙනස් කිරීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සපයා ඇත. කලින් කල පැවැත්වෙන බහුපාක්ෂික නිදහස් සාධාරණ මැතිවරණයක් මගින් සර්වජන ඡන්ද බලය උපයෝගී කර ගනිමින් ජනතාව එම කාර්‍යය කරයි. එහෙත් මෑත කාලයේ පැවැත්වුනු මැතිවරණ වලදී දූෂණ සහ ප්‍රචණ්ඩත්වය දක්නට ලැබිනි.

1999 වසරේදී, වසර 6 ක කාලය සඳහා තෝරාපත් කරගනු ලැබූ ජනාධිපතිනියත් ආසන 225 කින් සමන්විත පාර්ලිමේන්තුවත් අතර බෙදී යන බලය මත රට පාලන කෙරේ. අවසානවරට පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වුයේ 2001 වසරේදීය. එම මැතිවරණයෙන් එ.ජා.ප ප්‍රමුඛ සන්ධානයක් වූ එක්සත් ජාතික පෙරමුණට, ඊළඟ වසර 6 සඳහා ආණ්ඩු බලය අත්විය. එම මැතිවරණයේදී එල්.ටී.ටී.ඊ බල ප්‍රදේශවල පදිංචිව සිටි 40,000 ක් පමණ ජනතාවට, නිරීක්ෂණ කඳවුරු පසුකර ඡන්දය දීම සඳහා පැමිණීම, රජය විසින් තහනම් කරන ලදී. එයට හේතුවුයේ එල්.ටී.ටී.ඊ සාමාජිකයන් ඡන්දය මුවාවෙන් රට තුළට හොරෙන් රිංගා ඒම වැලැක්වීමය. මෙම ක්‍රියාව ද්‍රවිඩ ජනතාවගේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බව මෙම වසර තුලදීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරනු ලැබිය. තවද මැතිවරණයකදී ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය වලක්වාලීම හේතුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුදාපති, එවකට සිටි චන්ද කොමසාරිස් හා රජය වෙත දඩ මුදලක්ද නියම කෙරිණි. එහෙත් හමුදාපති පැවසුවේ ඔහු රජයේ නියෝග පිලිපැද ඇති බවත් එල්.ටී.ටී.ඊ ඡන්දය දීමේ මුවාවෙන් රජයේ පාලන ප්‍රදේශ වලට පැමිණීමේ සූදානමක් ඇති බවට තොරතුරු තිබිමත් ඊට හේතුවු බවය.

2001 මැතිවරණයට එය ගැනීමත් සමගම එ.ජා.පෙරමුණ රජයක් පිහිටවු අතර ජනාධිපතිනියගේ පක්ෂය වු පොදු පෙරමුණ විරුද්ධ පක්ෂය ලෙස කටයුතු ඇරඹීය. ජනාධිපතිනියත්, අගමැතිවරයත් අතර සුසංයෝගී සබැඳියාවක් පවත්වාගෙන යාම උදක්ම අසීරු කරුණක් විය. එයට, වඩාත් හේතුවුයේ ජනාධිපතිනිය හදිසි නීතිය ප්‍රකාශයට පත්කොට දින 15 කට පාර්ලිමේන්තුව කල්තබා ඇමතිවරු 3 දෙනකු නිලයෙන් පහකර, ආරක්ෂක අමාත්‍යාංශය තමන් යටතට පවරා ගැනීමත් සමඟය. එසේ කිරීමට ප්‍රමුඛ හේතුව ලෙස ජනාධිපතිනිය පෙන්වා දුන්නේ ජාතික ආරක්ෂාවය. වසර අවසාන වන තෙක්ම සාම වැයමේ අගමැතිවරයාගේ කාර්‍යභාරය මෙන්ම, පවරා ගත් අමාත්‍යාංශ තුනේ පාලනයත් පිළිබඳ දිගින් දිගටම අදහස් හුවමාරු වනු දක්නට ලැබිණි.

2001 ජුලි මස සිට සැප්තැම්බර් මාසය තෙක් ජනාධිපතිනිය පාර්ලිමේන්තුව අත්හිටවුවාය. මන්ත්‍රිවරුන් තම පක්ෂය හැරයාම නිසා පක්ෂය පරාජය වනු ඇතියි සිතු බැවින් එතුමිය එසේ කළ බව කියනු ලැබේ. පාර්ලිමේන්තුව අත්හිටුවීම විරුද්ධ පක්ෂවල නොසතුටටද හේතු වු අතර ඔවුන් එයට විරුද්ධව පෙළපාළි පවා

පැවැත්වූහ. එක් පෙලපාලියක් නතර වුයේ ආරක්‍ෂක හමුදා විසින් දෙදෙනකු මරා දමනු ලැබීමෙන්ද පසුවය. (2 බී කොටස බලන්න) ඉන්පසු ස්වකීය සන්ධානිකයන් සමඟ සාකච්ජා කිරීමෙන් අනතුරුව 2001 ඔක්තෝම්බර් මාසයේදී පාර්ලිමේන්තුව විසුරුවා හැරි ජනාධිපතිනිය 2001 දෙසැම්බර් මාසයේ මැතිවරණයක් පැවැත්වීමටද නියෝග කළාය.

පොදු පෙරමුණේ අපේක්ෂයකුගේ මැරවරයින් යයි සැක කෙරෙන කණ්ඩායමක් විසින් 2001 දෙසැම්බර් මස, මැතිවරණ දිනයේදී ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයේ ආධාරකරුවන් 12 දෙනකු මරාදමා තිබේ. ඒ සඳහා කුමන්ත්‍රණය කළේය යන චෝදනාව මත හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී (පො.පෙ) අනුරුද්ධ රත්වත්ත සහ ඔහුගේ පුතුන් දෙදෙනාට විරුද්ධව අධිකරණයේ නඩු පවරනු ලැබිය. ඝාතනයට හවුල් විමේ චෝදනාව මත ආරක්‍ෂක නිළධාරීන් ඇතුළු තවත් 15 දෙනකුටද විරුද්ධව චෝදනා නගන්නට යෙදුනි. මහාධිකරණයේ විශේෂ විනිසුරු මඩුල්ලක් දුන් තීන්දුව ඉවතලමින් ජුනි මාසයේදී ශ්‍රේෂ්ඨාධිකරණයේ පංච පුද්ගල විනිසුරු මඩුල්ලක් රත්වත්තේ මහතා ඇතුළු 14 දෙනකුට ඇප නියම කර ඇත.

2001 මැතිවරණයට පෙරාතුව ප්‍රධාන දේශපාලන පක්‍ෂ දෙක දැවැන්ත මර්ධනකාරී ක්‍රියාවන්හි යෙදුනත්, ඡන්දය පාවිච්චි කළ දායකයින්ගේ සංඛ්‍යාව 70% ඉක්මවිය. සාධාරණ නිදහස් මැතිවරණයක් සඳහා වු එහි, ප්‍රචණ්ඩ ක්‍රියා 755 ක් සහ ඝාතන 49 ක් පොදු පෙරමුණෙන්ද. ප්‍රචණ්ඩ ක්‍රියා 4208 ක් සහ ඝාතන 73 ක් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයෙන්ද පොලිසිය මගින් ප්‍රචණ්ඩ ක්‍රියා 2,247 ක් සහ ඝාතන 45 ක්ද වාර්තා කර තිබිණි.

2001 සැප්තැම්බර් මාසයේදී, නිදහස් මැතිවරණ කොමිසමක් පිහිටුවීම සඳහා (වෙනත් කොමිෂන් අතර) 17 වන සංශෝධානය අනුමත කරන්නට යෙදුනි. එහෙත් වසර අවසාන වනතෙක්ම එය ක්‍රියාත්මක කිරීමේ නිති රීති සම්පාදනය කර නොතිබිණි.

2001 මැතිවරණය නිරීක්ෂණය කරනු සඳහා යුරෝපා හවුලෙන් සහභාගි වු නියෝජිත පිරිස්, ඡන්දය පාවිච්චි කිරීමේදී දක්නට ලැබුණු ප්‍රචණ්ඩත්වය පිළිබඳ දැඩි කනස්සල්ල පළ කලද, ජනතා අභිප්‍රාය සැහෙන දුරකට පිළිබිඹු කිරීමට මැතිවරණයට හැකියාව තිබුණු බවට නිගමනය කර තිබිණි.

225 ක සාමාජිකත්වයෙන් යුත් පාර්ලිමේන්තුවට කාන්තාවන් 10 දෙනකුද තේරී පත් විය. කැබිනට් මණ්ඩලයේ එක් කාන්තාවකුත් සහ ශේෂ්ඨාධිකරණයේ කාන්තාවන් දෙදෙනකුගේත් නියෝජනයක් ඇත. 1999 කාන්තාවක් වු චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිනිය වශයෙන් තේරී පත්විය.

ද්‍රවිඩ ජාතිකයෝ 28 දෙනෙකුත් මුස්ලිම් ජාතිකයින් 24 දෙනෙකුත් පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රිවරුන් 225 දෙනාට ඇතුලත්ය.

2001 දෙසැම්බර් පාර්ලිමේන්තු මැතිවරණයේදී එල්.ටී.ටී.ඊ සංවිධානය, තම බලප්‍රදේශ තුල මැතිවරණ කටයුතු කිරීමට අවකාශ නොදුන් නමුත් ඇතැම් ද්‍රවිඩ පක්‍ෂ, නැගෙනහිර ප්‍රදේශයේ මැතිවරණ ප්‍රචාරක කටයුතු

කිරීම පිළිබඳ විරෝධතාවක් නොදැක්වූහ.

ඉන් පෙර වර්ෂවලදී එල්.ටී.ටී.ඊ සාමාජිකයෝ යාපනේ ප්‍රාදේශිය සභා යනාදියේ වැඩ කටයුතු අඩාල කිරීම සඳහා බිය ගැන්වීම් සහ ඝාතන උපයෝගි කරගත්හ. එහිදී ඔවුන් යාපනය මහනගර සභාවේ නගරාධිපතිවරුන් දෙදෙනකු මර දැමූ අතර, එහි සභිකයන් 17 දෙනෙකුට මරණීය තර්ජන එල්ල කළහ. එපමණින් නොනැවතුණු එල්.ටී.ටී.ඊ සංවිධානය තම සාම්ප්‍රදායික නිජබිම සේ සැලකෙන ප්‍රදේශවල පවා මහජන ඡන්දයෙන් තේරීපත් වූ ජනප්‍රිය දේශපාලනඥයින් කිහිපදෙනකුම ඝාතනය කෙළේය.

## 4 වන කොටස

## මානව හිමිකම් උල්ලංඝණය කිරීම් පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් ජාත්‍යන්තර සහ රාජ්‍ය නොවන සංවිධාන මගින් කෙරෙන පරීක්‍ෂණ සම්බන්ධව රජයේ ආකල්පය.

මානව හිමිකම් උල්ලංඝණය කිරීමේ සිද්ධීන් පිළිබඳ පරීක්ෂණ පවත්වන දේශිය හා ජාත්‍යන්තර කණ්ඩායම් කිහිපයක්ම බාධාවකින් තොරව ක්‍රියා කරති. රජයේ නිළධාරිහුද එම සංවිධාන සමග සහයෝගයෙන් ප්‍රතිචාර දක්වති. මානව හිතවාදී නියෝජිතායතන ඒකාබද්ධ සංවිධානය, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ මානව හිමිකම් සංගමය, සිවිල් අයිතිවාසිකම් සංගමය, සහ නීති හා සමාජ භාරකාරත්වය යනාදී ආයතන ඇතුළු මානව හිමිකම් පිළිබඳ රාජ්‍ය නොවන දේශිය සංවිධාන කිහිපයක්ම එහි ක්‍රියාත්මකය. ලියාපදිංචි වීමේදී රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියා පිළිවෙල, අරමුදල් ලැබෙන ආකාරය යනාදී තොරතුරු රජයට අවශ්‍ය වුවද, දේශිය හා විදේශිය. රාජ්‍ය නොවන සංවිධාන වල ක්‍රියාකාරකම්වලට ප්‍රතිවිරුද්ධ නීති රෙගුලාසි, රජය මගින් ඉදිරිපත් කර ඇති බවක් දක්නට නැත. යථොක්ත නියමයන් ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන වලින් සලකන ලද්දේ, මානව හිමිකම් සංවිධාන විසින් එල්ල කරන ලද විවේචන හේතුකොට ගෙන රාජ්‍ය නොවන සංවිධාන දැඩි පාලනයට හසුකර ගැනිමේ ප්‍රයත්නයක් ලෙසිනි.

ඒ අතර ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයට රැඳවුම් මධ්‍යස්ථාන කරා යාමට රජය කිසිදු බාධාවකින් තොරව අවකාශ සැලසීය. (1සී සහ 1ඩී බලන්න) ආරක්‍ෂක අංශවලට පුහුණුවත්, පුහුණුව සඳහා උපකරණත් සැපයුවේද එම සංවිධානය මගිනි. වන්නි ප්‍රදේශයට වෛද්‍ය අවශ්‍යතා සහ එයට අදාල වෙනත් සේවා සැපයීම කෙළේ එක්සත් ජාතින්ගේ මානව හිමිකම් කොමසාරිස් (□□□□□) සහ ජාත්‍යන්තර රතුකුරුස සංගමය ප්‍රමුඛ වෙනත් රාජ්‍ය නොවන සංවිධානයන්ය. (1ජී කොටස බලන්න)

මානව හිමිකම් කොමිසමට බලය හා ධනසම්පත් බෙහෙවින් ඇති අතර, අධිකරණයට වේවා සාක්ෂිකරුවන් වශයෙන් එම සංවිධානය නොකැඳවයි. එසේම ඔවුන්ගේ රාජකාරි කටයුතු පිළිබඳව ඔවුන්ට එරෙහිව නඩු පැවරීමද නොකෙරේ. □□□□ ආයතනය කියන අන්දමට මානව හිමිකම් කොමිසම ප්‍රමාණවත් තරම් කාර්යක්‍ෂම නොවේ. එය පරීක්ෂණ විෂයෙහිලා ක්‍රියා කෙළේ විනිශ්චය සභාවක් ලෙසිනි. එය අපරාධ නිරීක්‍ෂකයකු කරන අන්දමින් මුලික නිරීක්‍ෂණ කිරීමට අකමැති විය. ආයාචනාව ඉදිරිපත් කරන තැනැත්තාටම, ඔහුගේ පැමිණිල්ල සනාථ කිරීමේ සාක්ෂි ඉදිරිපත් කරන ලෙස කීම, ඔවුන්ගේ සිරිත විය. මානව හිමිකම් කොමිසම කිසි විටෙකත්

මානව හිමකම් උල්ලංඝනය පිළිබඳව වාර්ෂික වාර්තා ඉදිරිපත් කළේ නැත. කෙසේ වෙතත් ඔවුන් පොලිසි වලට ගමන්වාර 690 ක්ද අවතැන්වුවන්ගේ කඳවුරු වලට ගමන්වාර 96 ක්ද ගොස් තිබේ. මානව හිමිකම් උල්ලංඝණය කිරීම් පිළිබඳ සිද්ධීන් 2500 ක් ඔවුන්ට විසඳීම සඳහා තිබිණි. 2000 වසරේ බිඳුනුවැව ඝාතනය පිළිබඳ ඉක්මණින් පරීක්ෂණ පැවැත්වීම ගැන මානව හිමිකම් කොමිසමට කොතෙකුත් ප්‍රශංසා ලැබිණි.

## 5 වන කොටස

### ජාතිය, ස්ත්‍රී පුරුෂ බව, ආබාධිත බව. භාෂාමය වෙනස හෝ සමාජ තත්වය

නීතිය ඉදිරියේ සියලුම රටවැසියන් සමාන බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගනු ලැබ ඇති අතර රජයද එම අයිතියට ගරු කරයි. ස්වකීය මූලික මානව හිමිකම් උල්ලංඝණය වීම් සම්බන්ධයෙන් රටවැසියන් නඩු පැවරූ බොහෝ අවස්ථාවන්හිදී ශ්‍රෙෂඨාධිකරණයද එම අයිතිය තහවුරු කර ඇත. අධිකරණයට අතිරේකව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට රජය විසින් පිහිටුවා ඇති තවත් ආයතන දෙකක් වශයෙන් මානව හිමිකම් කොමිසමත් □□□□□ ආයතනයත් හැඳින්විය හැකිය. (1ඩී කොටස බලන්න)
එඩ්ස් (HIV) වැනි රෝග පැතිරවීම වැලක්වීම හා රෝග වාහකයන් පිළිබඳ උපදේශන සැපයුම් සේවා ආයතන කෙරෙහි වෙනස්කම් දැක්වීමක් දැන ගැනීමට නොමැති වුවත් සමාජීය වශයෙන් මෙම කණ්ඩායම් දෙස සුභවාදීව නොබලයි.

### කාන්තාවෝ

බොහෝවිට සුරාපානය හේතුකොට ඇති වන ලිංගික අයතා කටයුතු, ස්ත්‍රීන්ට පහරදීම යනාදිය දිගින් දිගටම ප්‍රශ්න බවට පත්ව තිබිණි. 1995 වසරේ නීති සංග්‍රහයට හඳුන්වා දුන් සංශෝධන එවැනි වැරදි වලට දිය යුතු දඬුවම් තවදුරටත් දැඩි ස්වභාවයක් ගැනීමට හේතුවිය. විවාහක කාන්තාවන් විෂයෙහිලා දූෂණය යන පදය අර්ථකථනය වන්නේ අධිකරණ තීන්දුවක් මත සහකරු / සහකාරිය වෙන්ව වෙසෙන විටය. එසේම ලිංගික අපයෝජනය සහ සේවා ස්ථානයේදී දූෂණයට ලක්වීම යනාදියද නීතියෙන් මානව ආවරණය වී තිබේ.. නීති සංග්‍රහය බොහෝ දුරට, ලිංගික අසහනකාරී ක්‍රියා මැඩලීමට හේතුවේයයි බහුතරයක් සිතුවද, ඇතැම් කාන්තා සංවිධාන වල අදහස වූයේ, පොලිසිය සහ අධිකරණ ක්ෂෙත්‍ර තුළ සංවේදී බවක් ඇති කරලීම අත්‍යවශ්‍ය බවය. එබැවින් 1994 වසරේදී කාන්තා හා ළමා ආරක්ෂණය සඳහා පොලිසිය තුළම කාර්‍යාංශයක් රජය මගින් පිහිටවූ නමුත් අපේක්ෂිත අන්දමින් වැඩිමනත් සංවේදී බවක් ඇති කිරීමට, එමගින් නොපිළිවන් විය. එම කාර්‍යාංශය මගින් ගත් ක්‍රියාමාර්ගයක් මෙතෙක් දැනගන්නට නැත.

වර්ෂයට අදාල කාලය තුළදී ආරක්ෂක නිළධාරීන් විසින් කරන ලද හා කිරීමට තැත් කළ ස්ත්‍රී දූෂණ පිළිබඳ දැනගන්නට ලැබී තිබේ. රතුකුරුස සංවිධානයේ වාර්තා අනුව පැහැදිලි වන්නේ, ඔක්තෝම්බර් මස 23 දා පොලිස් නිළධාරීන් දෙදෙනකු, මන්නාරම් දිස්ත්‍රික්කයේ උයිලන්කුලම්හිදි සෙල්වරාජ නැමැති කාන්තාවක් දූෂණය කිරීමට තැත් කළ බවකි. අගෝස්තු 26 දා එසේම යාපනයේ වඩමාරච්චි ප්‍රදේශයේදී, යුද සෙබලුන්

තිදෙනකු එක්ව තවත් කාන්තාවක් දූෂණය කිරීමට උත්සාහයක යෙදී ඇත. වර්ෂය ඇතුළත එම වසරේ ස්ත්‍රී දූෂණ 900 ක් පමණ සිදුවී ඇති බවත්, ඒ පිළිබඳ පරීක්ෂණ ඇරඹූ බවත් කියනු ලැබේ. 2002 වසරේ දූෂණ සංඛ්‍යාව වූ 865 ට සාපේක්ෂිකව බලන විට, එය වැඩිවීමකි. දූෂණ සංඛ්‍යාව එසේ ඉහළ ගොස් ඇතත්, ආරක්ෂක අංශ නිළධාරීන් වූදිතයන් වශයෙන් සැකකළ අවස්ථාවලදී, එවැනි අයට එරෙහිව ක්‍රියාකර ඇති බවක් දැනගන්නට නැත.

කාන්තාවන් සැපයීම සහ වෙළඳාම, පිළිබඳ නීතිය 1995 වසරේදී වඩාත් ශක්තිමත් කරන ලද නමුත්, බලෙන් ශ්‍රමය ලබා ගැනීම සඳහා කාන්තාවන් සැපයීම අඛණ්ඩවම දක්නට ලැබිණි. (6 එෆ් කොටස බලන්න) ගණිකා වෘතිය නීති විරෝධි වුවත් එය විශාල ගැටලුවක් බවට පත්වී තිබේ. ඇතැම් පොලිස් නිළධාරීන් මෙන්ම ආරක්ෂක නිළධාරීන්ද, එම අපයෝජනිය කායෲයන්හි නියැලුන බව සහ ඔවුන්ට ගණිකා වෘත්තිය අභිමත බවටද සාධක ඇත.

රාජ්‍ය අංශය තුළ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම රැකියා නියුක්තියේදී සම තැන් දෙන බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි සඳහන්ය.

කෙසේ වුවද පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත කාන්තාවන්ට සිදුවන, වෙනස්කම් හා නොසැලකිල්ල සම්බන්ධයෙන් කිසිදු ආරක්ෂාවක් නැත. ඒ අය පුරුෂ පක්ෂය හා සමාන ශ්‍රමයක යෙදුනද. ඔවුන්ට ගෙවනුයේ අඩු වැටුපකි. අධික්ෂණ තත්වයක උසස් වීමක් හෝ ලැබිම අසීරුය. එසේම ඔවුහු ලිංගික අතවර වලට කොතෙතුක් ලක්වන්නෝය. ශ්‍රම බලකායෙන් හරි අඩක්ම වාගේ කාන්තාවන් බවද මෙහිලා අමතක නොකළ යුත්තකි.

ජාතික, සිවිල් හා අපරාධ නීතිය යටතේ කාන්තාවන්ට ඇත්තේ සම අයිතියකි. එසේ වුවද දික්කසාද වීම දරුවන්ගේ භාරකාරත්වය සහ දේපල උරුමය යනාදිය ඇතුලත් ප්‍රශ්නවලදී, තීරණයට හේතු සාධක කරනුයේ ඒ ඒ ආගමික සාම්ප්‍රදායික නීතිය. ස්වකීය සාම්ප්‍රදායික හා ආගමික සිරිත් අනුගමනය කරන මුස්ලිම් ජාතිකයන් හැරුණු විට සෙසු කාන්තාවන්ට විවාහ විය හැකි අවම වයස අවුරුදු 18 කි. මෙම ආගමික හා වාර්ගික අවශ්‍යතා මත ගොඩ නැගුණ නීති හේතුකොට ගෙන කාන්තාවන්ට සිදුවනුයේ අසහනයකි, වෙනස්කමකි.

## ළමා ජිවිත

රජයට ළමා සුභ සාධනය පිළිබඳ අවශ්‍යතාවයක් තිබුණත් ඒ සඳහා අවශ්‍ය ධන සම්පත් වල හිඟයක් ඇත. ළමා සෞඛ්‍ය සහ සුභසාධනයට කල යුතු වියදම 1998 - 2001 අතරතුර දළ දේශිය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් පහළ බැස තිබිණි. කෙසේ වුවද සෞඛ්‍ය හා අධ්‍යාපනය අතින් සැහෙන පරිමාණයේ කටයුතු රැසක් සම්බන්ධයෙන් රජය ඇප කැප වි ක්‍රියා කළේය.

නීතිය අනුව වයස අවුරුදු 5-14 අතර ළමුන් අනිවාර්යයෙන්ම පාසල් යා යුතුය. වයස 16 න් පහල ළමයින් අතුරෙන් 85% ක් පමණ ළමෝ පාසල් යති. විශ්ව විද්‍යාලය තෙක්ම අධ්‍යපානයත්, ප්‍රතිශක්තිකරණය

ඇතුළු සෞඛ්‍ය සේවාවත් නොමිළේ කෙරෙන්නකි.

ළමයින් අයථා කටයුතු වලට යෙදවීමට හේතු වන ප්‍රධාන කරුණු ලෙස, රාජ්‍ය නොවන සංවිධාන බහුතරයක් සැලකුවේ, නීතිය ප්‍රමාණවත් නොවීම නොව නීතිය ක්‍රියාත්මක කිරීමේ දුබලතාවයක් නිසා බවය. ළමා හා කාන්තා ආරක්‍ෂක පොලිස් කායඛාංශය විසින් ළමයින්ට හා කාන්තාවන්ට විරුද්ධ, අපරාධ පිළිබඳ පරීක්ෂණ පවත්වන ලද්දේ වුවද, නීතිය ක්‍රියාත්මක කිරීමේ නිළධාරීන් බහුතරයක්ම, එල්.ටී.ටී.ඊ සංවිධානය හා ඇතිවූ ගැටුම්කාරී කටයුතුවලට මුදාහැර තිබිණි. 2002 සැප්තැම්බර් මාසයේදී ජාතික ළමා ආරක්‍ෂක අධිකාරිය (□□□□) සමග ඒකාබද්ධව, කෙළින්ම කටයුතු කිරීමට ප්‍රමාණවත් කාර්යාලයක් පොලිසිය විසින් විවෘත කරන ලදි. ළමා අපචාර යනාදියට සැක කරනලද අය අත්අඩංගුවට ගැනීම සහ පරීක්ෂණ පැවැත්වීම, එමගින් ඒකාබද්ධව කිරීමට ඔවුහු බලාපොරොත්තු වෙති.

ළමා අපචාරය යන්න නීතියෙන් නිර්වචන කර ඇත්තේ සියලුම වර්ගයේ ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා, ළමයින් වෙළදාම සහ ළමුන්ට පීඩාකාරී අන්දමින් කටයුතු කිරීමද ඇතුලත් වන පරිදිය. අයුතු අන්දමින් ශ්‍රමය ළබා ගැනීමට, නීති විරෝධී කටයුතුවලට ළමයින් යොදා ගැනීමට මෙන්ම අනිවාර්යය අධ්‍යාපනය බාධා වන කායඝියන්ට හෝ ළමයින් උපයෝගී කර ගැනීමද නීතියෙන් තහනම්ය. එසේ ළමයින් යුද්මය කටයුතු සඳහා යොදා ගැනීම ද තහනම් වන ආකාරයෙන් මෙම නීති රීති පුළුල් කර තිබේ. ළමා ආරක්ෂා අධිකාරියට අධ්‍යාපන, වෛද්‍ය, විශ්‍රාමික පොලිස් සහ නීති කේෂේත්‍රවල නියෝජිතයන් ඇතුලත් වන අතර එය ජනාධිපතිනියට සෘජුවම වගකීම යුතු වන්නේය.

ළමා අපචාරයෙහි යෙදෙන අයට විරුද්ධව නඩු පැවරීමට ජාත්‍යන්තර මට්ටමින් ඇති අවකාශ හා නෛතික ආවරනයක්ද රජය සාක්ෂාත් කරගෙන සිටී ළමා අපයෝජන සම්බන්ධයෙන් වැරදි කරුවන්ට වසර 5 සිට උපරිම වසර 20 තෙක් සිර දඬුවම්ද, නිශ්චිතව සඳහන් කර නැති දඩයක්ද නියම කිරීමට නීතියෙන් ඉඩ සලසා තිබේ. වසර ඇතුලත එවැනි නඩු 11 ක් විනිශ්චයට ගත් නමුත් එක් අයකු හෝ වරදකරුවෙකු වී නොමැත.

වෙරළ බඩ ඇතැම් පෙදෙස්වල ළමා අපයෝජනය බලගතුම ප්‍රශ්නයකි. දිවයිනේ ළමා දූෂකයන් 2.000 ක් පමණ සිටින බව රජය ඇස්තමේන්තු කර ඇතත්, ඇතැම් පෞද්ගලික අංශ පවසන්නේ මෙම සංඛ්‍යාව ඉතා ඉහල බවයි. (6 එෆ් කොටස බලන්න) ළමා අපචාර අතර වඩාත්ම ඇත්තේ ලිංගික දූෂණයයි. ඇතැම් දූෂකයන් විදේශිකයන්ට සේවා සපයන තරුණයන්ය. සමහර ළමුන් ඇත්ත වශයෙන්ම දූෂණයට බලෙන් පොළඹවාගත් අයවලුන්ය. පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව රාජ්‍ය නොවන දේශිය ආයතන සමග ඒකාබද්ධව, ළමයින්ට ආරක්ෂාව සහ සෙවන ලබා දෙයි. පහසුවෙන් අපචාරයට ගොදුරු විය හැකි ළමයින් පිළිබදව සංචාරක මණ්ඩලය විසින් අදාල අංශ දැනුවත් කිරීමේ වැඩ සටහනක්ද පවත්වා තිබේ.

එල්.ටී.ටී.ඊ සොල්දදුවන් වශයෙන් මෙන්ම ආධාරක සේවා සඳහාද ළමයින් ගෙන තිබේ. අවුරුදු 13 තරම් බාල වයසේ ළමයින්ද ඔවුන් බඳවා ගත් බව පෙනේ. ඉන් ඇතමෙක් හමුදාවට බාර වූ අතර එල්.ටී.ටී.ඊ

සංවිධානයේ ළමයින් බඳවා ගැනීම දියුනු ආකාරයෙන් කිරීමටද මැලි නොවූහ. (1ජී බලන්න) වයස 17 න් පහළ ළමයින් බඳවා නොගන්නා බවට, එල්.ටී.ටී.ඊ ය 1998 වසරේදී එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයාගේ නියෝජිතයාට කියා සිටියේය. එහෙත් ඔවුහු එම ප්‍රතිඥාව කඩ කර, සාම ක්‍රියාදාමය පවත්නා කාලය තුළදී පවා, ළමයින් බඳවා ගැනීම කළ බවට වාර්තා ඇත. (6ඞී කොටස බලන්න)

උදාහරණයක් ලෙස එක්සත් ජාතීන්ගේ 'යුනිසෙෆ්' ආයතනයට අනුව වර්ෂය ඇතුළත, බලෙන් ළමයින් බඳවා ගැනීම් 700 කි. වසර අවසාන වන විටත් ඔවුන් භාරයේ ළමයින් 1300 ක් රඳවාගෙන තිබිණි. වසර අවසානයේදී ළමයින් යුද කටයුතු වලින් මුදවා ගැනීම පිණිස රජය, අන්තර් කලාපීය ව්‍යාපෘතියක්ද ඇරඹීය. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ළමා ශ්‍රමයට එරෙහි ජාත්‍යන්තර සංවිධානය 1996 සිට රජය සමග එම කාර්‍යයෙහි නිරතවිය.

## ශාරීරක දුබලතා ඇති අය

කායික දුබලතා හේතුකොට ගෙන කිසිවකු නොසලකා සිටිය නොහැකි බව නීතිය පිළිගනී. එවැනි දුබලතා සහිත අධ්‍යාපන සුදුසුකම් ඇති අයට, ඇතැම් රාජ්‍ය සේවා අංශයන්හි කිසියම් කොන්කිරීමක් සිදුවන බව සත්‍යයකි. ජනතාවගෙන් 7% ක්ම කිසියම් දුබලතාවයකින් පෙලෙන බව ලෝක සෞඛ්‍ය සංවිධානය පවසයි. මානසිකව හා ශාරීරකව දුබලව සිටින අය සඳහා වෘත්තිය අභ්‍යාස පාසල් 08 ක් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ඇරඹීය. එසේම උපාධිලාභීන්ටද රැකියා සඳහා අභ්‍යාස පාඨමාලා ඒ සමගම ආරම්භ කරන්නට යෙදුනි. ආබාධිතයන් සඳහා උපකරණ සැපයීම, ශාරීරික දුබලතා ඇති අයගෙන් කෙරෙන මිලදී ගැනීම් ආදියෙන් රජය ඔවුන්ට තවත් උපකාරී විය. රාජ්‍ය නොවන සංවිධාන මගින් පවත්වනු ලබන අභ්‍යාස පාසල් හා ආයතන 74 ක් ලියාපදිංචි කිරීමට රජය සමත් විය. ශරීරාබාධ සහිත 200,000 ක පමණ පිරිසකට රැකියා සොයා දීමේ නිළධාරීන් පිරිසක්ද සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කෙරිණි. මේ කවර අන්දමේ පහසුකම් තිබුණ නමුත් සමාජය ඔවුන් දෙස වපර ඇසින් බැලීම හේතුකොට ගෙන දුබල තැනැත්තෝ අදත් දුෂ්කරතා රැසකට මුහුණපා සිටිති.

## ආදිවාසීන්

ශ්‍රී ලංකාවේ ආදිවාසීන් වන වැදි ජනතාව එක්දහස නොඉක්මවයි. ඉන් ඇතැමෙක් ස්වකීය සාම්ප්‍රදායික අනන්‍යතා ලක්‍ෂණ රැක ගැනීමට උත්සාහ කරන අතර, රජයද එයට සහයෝගය දක්වයි. ඔවුන් සෙසු ජනතාවගේ දේශපාලන හා ආර්ථික ජීවිතයට සම්බන්ධ වීම පිළිබඳ සීමා පැනවීමක්ද නැත. රක්‍ෂිත වනාන්තර වල ඔවුන්ගේ නිජබිම් වලින් ඔවුන් ඈත් කර දැමීමේ ප්‍රයත්නයක් ඇති බවට වැදි ජනතාව පැමිණිලි කරති.

## ජාතික හා වාර්ගික සුළු ජන කොටස්

19 වන සියවසේ තේ වගා කටයුතු සඳහා ඉන්දියාවෙන් ගෙන ආ ද්‍රවිඩ ජාතිකයින්ගෙන් පැවත එන, ද්‍රවිඩ වතු කම්කරුවෝ දශ ලක්ෂයක් පමණ වේ.

ඔවුන්ගෙන් 75,000 ක් පමණ අය, පුරවැසිකම ලැබීමට සුදුසුකම් නැති අතර, අධ්‍යාපනය සඳහා රජයේ මුදල් වෙන් කරලිම අතින්ද කොන් කරනු ලැබූ පිරිසකි. ජාතික හැඳුනුම්පතක් පවා නොමැති බැවින්, ඔවුන් ආරක්ෂක නිළධාරීන් විසින් නිරන්තර හිරිහැරයට බඳුන් කරන්නටද යෙදුනි. එහෙත් රජය නිතරම කියන්නේ ඔවුන් එක් අයකුද බලය යොදා රටින් පිටුවහල් නොකරන බවය. 1999 වසරේදී රජය ඔවුන් ලියාපදිංචි කිරීම ආරම්භ කළ අතර, 2001 වසර වන විට 15,300 දෙනකුට ඒ අනුව හැඳුනුම්පත් නිකුත් කරන ලදි. ඔක්තෝම්බර් 7 වෙනිදා 160,000 ක් වන වතු කම්කරු ජනතාවට පුරවැසිකම් දීමට රජය පනතක් අනුමත කළේය.

විශ්ව විද්‍යාල අධ්‍යාපනය, රජයේ රැකියා හා රජයේ පාලනය යටතේ ඇති වෙනත් ක්ෂෙත්‍ර වලින් තමන් කොන් කරනු ලැබීම ඔවුන්ගේ කනස්සල්ලට හේතු විය.

## 6 කොටස
## කම්කරු අයිතිය

### ඒ. සමිති සමාගම් පැවැත්වීමේ නිදහස

සමිති සමාගම් පැවැත්වීමට ඔවුන්ටද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති හිමිකම් රජය පිළිගනී. එසේම වෘත්තිය සමිති නායකයන්ද මහජන ඡන්දයෙන් පත්වී පාර්ලිමේන්තුවේ සිටිති. ඕනෑම වෘත්තියක පුද්ගලයන් 7 දෙනකු සිටිත්නම් වෘත්තිය සමිතියක් පිහිටුවීමට, නායකයන් පත්කිරීම , ව්‍යවස්ථාවන් සම්මත කිරීමේ අවකාශ ඇත. එසේ වුවත් වෘත්තිය අයිතිවාසිකම් හේතුවෙන් පරිපාලනය ප්‍රමාදවීම් ඇතිවන බැවින් වෘත්තිය සමිති කටුයුතු කෙරෙහි සේවකයන් අධෛර්යයමත් කරයි. දශ ලක්ෂ 6.9 ක පමණ වතු කම්කරුවන් අතුරෙන් 20% ක්ද කඳුරට වතු කම්කරුවන් 70% ක්ද වෘත්තිය සමිති වලට බැඳී සිටිති. ඔවුන් අතර දශලක්ෂයට වැඩි සංඛ්‍යාවක් වෘත්තිය සංගම් සාමාජිකයෝය. කෘෂිකාර්මික නොවන, පෞද්ගලික අංශයේ ශ්‍රම බලකායෙන්, සියයට 15-20% අතර සංඛ්‍යාවක්ද එසේම වෘත්තිය සමිති සාමාජිකයෝ වෙති. විශාල පරිමාණයේ පෞද්ගලික සමාගම්වලද වෘත්තිය සමිති ඇතත්, කුඩා පරිමාණයේ කෘෂි කාර්මික හා ව්‍යාපාරික සේවකයන් වෘත්තිය සමිති සාමාජිකත්වය ගැන වැඩි උනන්දුවක් නැත්තෝය. රාජ්‍ය අංශයේ වෘත්තිය සමිති ප්‍රබලය.

රාජ්‍ය අංශයේ ප්‍රමුඛ පෙළේ වෘත්තිය සමිති ස්වාධීනව ක්‍රියා කළත්, සමහර වෘත්තිය සමිති දේශපාලනය නැඹුරුවකින් කටයුතු කර ඇත. කම්කරු සමිති 30 කට වැඩි ප්‍රමාණයක් දේශපාලන පක්ෂවලට එක්ව ක්‍රියා කරති. ඒ අතර වෙනත් පුළුල් වෘත්තිය සමිති හා ඒකාබද්ධ නොවූ, එහෙත් සාපේක්ෂිතව බලන විට විශාල සාමාජිකත්වයක් ඇති වෘත්තිය සමිතිද තිබේ. 2002 වසර තුළ රැකී රක්ෂා හා කම්කරු අමාත්‍යාංශය වෘත්තිය සමිති 174ක් ලියාපදිංචි කළ අතර, එම වසරේ අවලංගු කළ සමිති සංඛ්‍යාව 150 කි. ඒ අනුව ක්‍රියාත්මක සමිති

සංඛ්‍යාව 1,689 ක් ඒ වසර තුළ තිබිණි. ඉන් මැනවින් ක්‍රියාත්මක වුයේ සමිති 500 ක් පමණි. වාර්ෂික ප්‍රගති වාර්තා ඉදිරිපත් නොකරන වෘත්තිය සමිති, අවලංගු කිරීමේ බලය රැකීරක්‍ෂා සහ කම්කරු අමාත්‍යාංශයට නීතියෙන් පැවරී තිබේ.

එවැනි ලියාපදිංචි කිරීමක් අවලංගු කිරීමට ඇති නෛතික ප්‍රතිපාදනය එයම පමණි. ස්වාමි පක්‍ෂය විසින් වෘත්තිය සමිති පිළිගත යුතු බවටත් සාමුහික මට්ටමෙන් අයිතිවාසිකම් සඳහා ක්‍රියා කිරීමට ඒවාට ඇති අයිතියට ගරු කිරීමටත්, ඒවායේ පැවැත්මට විරුද්ධව කටයුතු නොකිරීමටත් 1999 වසරේදී පාර්ලිමේන්තුවේ පනතක් සම්මත කරන්නට යෙදුනි. එය ක්‍රියාත්මක කෙරිණි. වෘත්තිය සමිති ක්‍රියාමාර්ග හේතුකොට ගෙන සේවයෙන් පහකළ ස්වාමි පක්‍ෂය එම සේවකයන්ට වෙනස්කමක් කිරීම ඔප්පු වු විට ඒ සඳහා සේවකයන්ට වන්දි ගෙවීමට සිදුවේ. එහෙත් ඔවුන් ස්ථාන මාරු මත විවිධ ස්ථාන වලට යැවීමට ඔවුන්ට අයිතියක් ඇත. වෘත්තීය සමිතිවල පැවැත්මට එරෙහිව සේවකයන්ට වෙනස්කම් කිරීම ඩොලර් 200 (රු.20,000) ක දඩයකට යටත් කළ හැකි වරදකි.

ජුලි මස 9දා කටුනායක නිදහස් වෙලද කලාපයේ පිහිටි සීමාසහිත ජැක් ලංකා සමාගමේ සාවද්‍ය ජනමත විමසීමකට එරෙහිව ජාත්‍යන්තර නිදහස් වෘත්තිය සමිති සංගමය, **(ICFTA)** ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සමිති පැවැත්වීමේ නිදහස පිළිබඳ කමිටුව ඉදිරියේ, රජයට විරුද්ධව නඩුවක් පැවරීය. වසර අවසානයේ දෙපක්‍ෂයම එකඟත්වයට පත්ව, එම නඩුව සමතයකට පත් කරනු ලැබීය. සමිති වලට ජාත්‍යන්තර සංගම් හා ඒකාබද්ධ වීමට නිදහස ඇති අතර එසේ කර ඇති සමිති කිහිපයක් තිබේ.

### බී. සාමුහිකව සංවිධානගත වීමේ හා හිමිකම් ඉල්ලීමේ නිදහස

සාමුහිකව හිමිකම් පිළිබඳ කරුණු කියා සිටීම සඳහා නෛතික ප්‍රතිපාදන වලින් අවකාශ සැලසී ඇත. එහෙත් ඒ අනුව ක්‍රියා කරනුයේ සංගම් අතලොස්සක් පමණි. ශ්‍රී ලංකා ස්වාමිවරුන්ගේ මහා සංගමයට අයත් සමාගම් 50 ක් පමණක්, වසර අවසානයේදී එවැනි සාමුහික ගිවිසුමකට අත්සන් කර තිබිණි. සියළුම සාමුහික ගිවිසුම් කම්කරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතුය. වසර අවසාන වන විට අත්සන් කර තිබුණ එවැනි ගිවිසුම් සංඛ්‍යාව 128 කි.

නිදහස් වෙළඳ කලාපයේ, වෘත්තිය සංගම් හිමිකම් උල්ලාංඝණය කිරිමේ සිද්ධීන් කිහිපයක් සිදුවූ බව ජාත්‍යන්තර නිදහස් වෘත්තිය සමිති සම්මේලනය (□□□□□□) වාර්තා කර තිබිනි. නිදහස් වෙළඳ කලාපය තුළ ක්‍රියාත්මක වුයේ වෘත්තිය සමිති 7 ක් පමණි. එයට හේතුව සමිති, සංවිධාන කරන අයවලුන්ට නිදහස් වෙළඳ කලාපයට නිදහසේ ඇතුල්වීමට එරෙහිව පනවා ඇති සීමා කිරීම්ය. 2002 ඔක්තෝම්බර් මාසයේ ආයෝජන මණ්ඩලය නව කම්කරු ප්‍රඥප්ති සංග්‍රහයක් නිකුත් කෙළේය. එහි පරමාර්ථය වුයේ නිදහස් වෙළඳ කාලපයද ඇතුළුව, අයෝජන මණ්ඩලයේ වෘත්තිය සමිති සහ එම සමිතිවලට ඇති සාමුහිකව ක්‍රියා කිරීමේ අයිතිය පිළිගැනීමට සැලැස්වීමය.

සාමුහිකව කරුණු කියා සිටීමේ ඒකක (Unit) වෘත්තිය සමිති ලෙස පිළිගෙන ඇත්තේ කර්මාන්තශාලා

200 ක් අතුරෙන් 4 ක් පමණය.

නිදහස් වෙළඳ කලාපයේ කර්මාන්තශාලාද ඇතුළත්ව, අයෝජන මණ්ඩලයට අයත්, සේවක සේව්‍ය-පක්‍ෂ, රාජ්‍ය අංශයේ නියෝජිතයන් යනාදී අයගෙන් සමන්විත කම්කරු මණ්ඩල මගින් කළමනාකරණය පහසුකරලීමේ අවස්ථා සලසනු ලැබේ. අළුතෙන් සකස් කර ඇති, අයෝජන කලාපීය කම්කරු ප්‍රඥප්ති සංග්‍රහයට අනුව, එම මණ්ඩලයට ඒකාබද්ධ ගිවිසුම් අත්සන් කිරීමට සහ හිමිකම් පිළිබඳ කථා කිරීමටද බලය තිබේ. එහෙත්, මෙතෙක් එවැනි ගිවිසුම් එකකුදු අත්සන් කර නැත. ශ්‍රම උපදේශකයන් පවසන්නේ සේවක සංගමය ක්‍රියාශීලි නොවන බවය.

පොලිසිය, සන්නද්ධ හමුදාව, බන්ධනාගාර නිළධාරීන් ඇතුළු අත්‍යවශ්‍ය අංශ හැර සෙසු සැමටම වැඩවැරීමේ නිදහස තිබේ. ස්වකීය අයිතිවාසිකම් රැකගැනීම අරභයා, කම්කරු කොමසාරිස්ට, කම්කරු උසාවියකට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු කියාපැවේ අයිතිය කම්කරුවන්ට තිබේ. මෙම වැඩ පිළිවෙල ඵලදායී එකක් වුවද, තීරක තීන්දු දීමට වෙන් කර ඇති කාලසීමාව නව සංශෝධන අනුව සීමාකර තිබේ. විසඳීමට තිබෙන නඩු එකතුවී ඇත. ඕනෑම කර්මාන්තයක් අත්‍යාවශ්‍ය සේවයක් බවට ප්‍රකාශයට පත් කිරීමේ බලය ජනාධිපතිය සතුය.

රාජ්‍ය සේවා කොමිසමට, දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමට සිවිල් නිළධාරීන්ට හිමිකමක් ඇත. රාජ්‍ය සේවා කොමිසමේ තීරණය අසතුටුදායක නම්, 17 වන සංශෝධනයට අනුව ජුලි මස පිහිටවූ පරිපාලන අභියාචනා කොමිසමට අභියාචනාවක් කිරීමට ඔවුන්ට අවකාශ ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, මූලික හිමිකම් ආරක්‍ෂක විධිවිධාන යටතේ ඔවුන්ට අධිකරණයේ පිහිට සෙවීමටද පිළිවන.

පසුගිය වසර කිහිපය තිස්සේම ගමනා ගමන සේවයේ සේවකයන් මෙන්ම, වෛද්‍ය, අධ්‍යාපන, විදුලිය සහ වෙනත් විවිධ ක්‍ෂෙත්‍රයන් රැසකම සේවකයෝ වැඩ වැරූහ. රාජ්‍ය සේවයේ අය පමණක් නොව පෞද්ගලික අංශයේද ඇතැම් සේවකයෝත් වැඩ වර්ජනයන්හි යෙදුනාහ.

අත්‍යාවශ්‍ය නොවන සේවාවන්හි සේවකයන් වැඩ වර්ජනය කිරීම හේතුකොට ගෙන ඔවුන්ගේ පළිගැනීම වැනි ක්‍රියාවලට නීතියෙන්ද අවකාශ නැත. ස්වාමී පක්‍ෂයට, සේවකයකු ඉවත් කළ හැකි වන්නේ, විෂමාචාර හේතු කොට ගෙනය. එයද විධිමත් විනය පරීක්ෂණයකින් අනතුරුවය. සේවකයකු සේවයෙන් පහ කරන ලද්දේ වුවද එයට විරුද්ධව කම්කරු උසාවියේ නඩු පැවරීමට සේවකයාට අයිතියක් තිබේ.

අයෝජන මණ්ඩලයෙන් ක්‍රියාත්මක කැරෙන අපනයන ප්‍රවර්ධන කලාප / කාර්මික උද්‍යාන 12 හේ සේවකයන් 125,000 ක් පමණ සේවය කරති. ඉන් බහුතරයක් කාන්තාවෝය. නීතිය අනුව අපනයන ප්‍රවර්ධන කලාපයේ සේවක සේවිකාවන්ටද වෙනත් සේවකයන්ට මෙන් වෘත්තිය සමිති වලට බැඳීමට අවකාශ තිබේ. එහෙත් එම කලාපයේ ඇත්තේ වෘත්තිය සමිති අල්පයකි. එයට හේතුව එහි පවත්නා දැඩි සීමා කිරීම්ය. බාහිර වෙනත් ස්ථානවල වෘත්තිය සමිති සාමාජික සංඛ්‍යාව 20% ක් පමණ වුවද එම කලාපය තුළ එය 10% කි. කම්කරු නියෝජිතයන් කියා සිටින්නේ අපනයන ප්‍රවර්ධන කලාපයේ වැටුප් හා සේවා කොන්දේසි නියම කිරීමේ

කායභාරය පැවරී ඇති රජයේ අයෝජන මණ්ඩලය, වෘත්තීය සමිති පිහිටුවීම අධෛර්‍යමත් කර ඇති බවකි. කෙටි කාලීන සේවා නියුක්තියත් ශ්‍රම බලකාය නොමේරූ පිරිසක් වීමත්, වෘත්තීය සමිති සංවිධානයට බාධාවක් බවය. ඔවුන් පවසන්නේ සේවක නියෝජිතයන්ට කලාපය තුල කළ හැකි එකම දෙය, යම් යම් දේ නිර්දේශ කිරීමක් බවය. අයෝජන කලාපය නොබෝදා නිකුත් කළ කායසංග්‍රහයක සඳහන්ව තිබුණේ, ප්‍රවර්ධන කලාපයේ සේවක මණ්ඩලයට, ඒකාබද්ධ ගිවිසුම්, සාමුහික ඉල්ලීම් හා කාර්මික ආරවුල් පිළිබඳව පොදු කරුණු විෂයෙහිලා නියෝජනය කල හැකි බවය. වෘත්තීය සමිති සමග ඒකාබද්ධ ගිවිසුමකට එලඹීම හෝ, ඒ පිළිබඳ සැලකිලිමත් වීම හෝ ප්‍රතික්ෂේප කරන ස්වාමී පක්ෂයට එරෙහිව ක්‍රියා කිරීමට කම්කරු කොමසාරිස්වරයා පසුබට වන්නේ, අයෝජන මණ්ඩලයේ ප්‍රතිගාමී ක්‍රියාවන්ට යටවීම නිසා බව කම්කරු නියෝජිතයෝ වැඩිදුරටත් ප්‍රකාශ කරති. කලාපයේ සේවකයන් වෙනත් බාහිර කම්හලවල සේවකයන්ට වඩා වැඩි වැටුපක් ලබන නමුත්, ආරක්‍ෂාව නැතිකම, නේවාසිකාගාර තුළ පවත්නා අසහනකාරී තත්වය, ඉහළ නේවාසික ගාස්තු සහ ලිංගික අපචාර යනාදිය ඔවුන්ගේ දැඩි කනස්සල්ලට හේතුවී තිබේ. එපමණක්ද නොව බාහිර සේවා ස්ථාන සඳහා අවම වැටුප් හා පාරිසරික තත්වය නිගමනය කරනුයේ වැටුප් මණ්ඩලය මගින් වුවද එවැනි දෙය කලාපය සඳහා නිගමනය කරන්නේ අයෝජන කලාපයේ බලධාරීන් බවද කියමින් සේවකයෝ මැසිවිලි නගති.

### සී. බලෙන් වැඩ ගැනීම හෙවත් බන්ධිත ශ්‍රමය පිළිබඳ තහනම

නීතියෙන් බලෙන් සේවය ගැනීම හා බන්ධිත ශ්‍රමය තහනම් කර තිබුණද එය සුලභව සිදුවන බවට වාර්තා ඇත. ළමයින් සම්බන්ධව නීතියේ සඳහනක් හෝ තහනමක් කර නැති නමුත් රජය පවසන්නේ එය සියළුම වයස් කාණ්ඩවලට අදාල වන බවයි. (6ඩී කොටස බලන්න) සාමන්‍ය ගැමි පලාත්වල ළමුන් නාගරික නිවෙස්වල මෙහෙකාරකම් කිරීමට යොදා ගන්නා බවටත් ඔවුන්ට විවිධාකාර වධහිංසා වලට භාජනය වීමට සිදුවන බවටත් පිළිගත හැකි තොරතුරු ලැබී ඇත.

### ඩී. පාසල් යාමේ අනිවාර්ය වයස හා ළමා ශ්‍රමකයින්

පවුලේ කෘෂිකාර්මික වැඩවලට හෝ තාක්ෂණික අභ්‍යාස වලට හෝ ඇතැම් මව්පියන් හෝ භාරකරුවන් බාලවයසේ ළමුන්ගේ ශ්‍රමය ලබාගන්නා නමුදු රැකියා නියුක්තිය සඳහා අවම වයස අවුරුදු 14 කි. වයස අවුරුදු 14 නොඉක්මවූ ළමයින් එයට අමතර කිසිදු සේවයක නොයෙදිය යුතු බව, කාන්තා හා ළමා සේවා නියුක්ති පනතට, පසුකාලීනව ඉදිරිපත් කළ සංශෝධනයකින් නියම කර ඇත. පාසල් යාමේ අනිවාර්ය වයස, පනතට අනුව වයස 5-14 අතර ළමුන් පාසල් යායුතු බව කියැවේ. 1998 වසරේ සිටම එය ක්‍රියාත්මකය. එහෙත් 1998-1999 වසර වල පැවැත්වූ සමාලෝචනයකින් අනාවරණය වුයේ, වයස අවු 5-14 අතර ළමුන් 11,000 ක් පූර්ණකාලීන සේවා නියුක්තියන් වන අතර තවත් 15,000 ක්, ළමුන් ගෘහ සේවයේ හෝ වෙනත් ආර්ථිකයට සම්බන්ධ ක්‍ෂෙත්‍රයෙහි නිරතව සිටින බවය. රටපුරා ළමුන් 450,000 ක් ඔවුන්ගේ පවුල්වල අයවලුන් විසින් කෘෂිකාර්මික කටයුතු වලට යොදා ඇති බවද, තවදුරටත් අනාවරණය විය. වයස 14-18 අතර අයවලුන් සේවයෙහි යෙදීම පාලනය වන්නේ කාන්තා හා ළමා රැකියා නියුක්ති පනතින් සහ කර්මාන්තශාලා ආඥා පනත මගිනි. වයස 18 ට අඩු අය, අත්පාවලට හානිවිය හැකි අන්තරකාරී ව්‍යවසායන්හි, නොයෙදිය යුතුය.

වතුවල හා වෙනත් වැවිලි ක්ෂෙත්‍රයේ සහ වෙනත් ක්ෂෙත්‍රවල ළමුන් සේවයට යොදාගෙන ඇති නමුත්, අපනයන ප්‍රවර්ධන කලාපයේ හෝ අපනයන ක්ෂේත්‍රයේ එවැනි සිද්ධීන් ගැන වාර්තා වී නැතත් අස්වැන්න නෙලීමේ කාලවලදී ළමුන් සේවයේ නිරතව කරගෙන ඇත. එහෙත් ගෘහ සේවකයන් ලෙස දහස් ගණනින් ළමුන් යොදාගන ඇතත් එය සීමා කිරීමට හෝ කිසියම් පාලනයකට නතු කිරීමට හෝ ක්‍රියාකිරීමක් නැත. දකුණු පළාතේ නිවෙස් අතුරෙන් 8.6% කම ගෘහ සේවයෙහි ළමයින් යොදාගෙන ඇති බව 1997 අධ්‍යයනයකින් අනාවරණය විය. එසේම ඔවුන්ට කිසිදු අධ්‍යාපනයක්ද ලබා නොදෙන බව කියැවේ. ඉන් බහුතරයක් මානසික, ශාරීරික හා ලිංගික අතවරයන්ටද ගොදුරු වෙති. පවුලේ ව්‍යවසායන් වන, කලා ශිල්ප, වෙළඳසැල් වැනි ස්ථානවලද ළමයින් සේවයෙහි යොදවා ඇති බවට වාර්තා ඇත.

ළමාරක්ෂණය සහ සම්බන්ධීකරණය පිළිබඳ මධ්‍යම නියෝජිතායතනය වන්නේ ජාතික ළමා ආරක්ෂා අධිකාරියයි. ළමා ශ්‍රමය පිළිබඳ නීති රීති ක්‍රියාත්මක කිරීම බාරව ඇත්තේ පරිවාස හා ළමා ආරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ පොලිසියටය. රජයේ අධීක්ෂණය ළමා ශ්‍රමය ඉවත් කිරීමට ප්‍රමාණවත් නොවේ. (5වන කොටස බලන්න) ඔවුන්ට කළ හැකිවුයේ දැනුවත් කිරීම් මගින් නඩු පැවරීමේ සංඛ්‍යාව වැඩි කිරීමය. 2002 වසරේදී කම්කරු දෙපාර්තමේන්තුව ළමා සේවා නියුක්තිය පිළිබඳ පැමිණිලි 161 ක් වාර්තා කළ අතර ඉන් නඩු 72 ක් සාක්ෂි නොමැතිකම නිසා හෝ පැමිණිලි සාවද්‍ය වු නිසා හෝ ඉල්ලා අස්කර ගන්නට යෙදිනි. ජනවාරි මාසයේ සිට ජුලි මාසය තෙක් කම්කරු දෙපාර්තමේන්තුව පැමිණිලි 102 ක් වාර්තා කර ඇතත් ඉන් 14 ක් ඉල්ලා අස්කර ගන්නට යෙදිනි. 23 කට නඩු පවරනු ලැබිනි. බාලවයසේ අය සේවයෙහි යෙදීම පිළිබඳ පමුණුවන දඬුවම රු. 1000/- (ඩොලර් 10) සහ / හෝ හය මසක සිරදඬුවමේ සිට රු. 10000/- (ඩොලර් 100) සහ / හෝ මාස 12 ක සිර දඬුවමක් වන සේ ප්‍රතිශෝධනය කෙරිනි.

කිසිම වයස් සීමාවක අයකු බන්ධිත (දාස) මෙහෙවරට නොයොදන ලෙස නීතියෙන් නියමව ඇතත් ඇතැම් ගැමි ළමයින් එවැනි සේවාවන්හි යොදාගෙන ඇත. (5 සහ 5 කොටස් බලන්න)

අරැක්කැමියන්, පණිවුඩකරුවන්, ලිපිකරුවන් සහ සොල්දාදුවන් වශයෙන් එල්.ටී.ටී.ඊ ය, ළමයින් යොදාගෙන තිබේ. ඇතැම් තැනක ආරක්ෂක බලකොටු ගොඩ නැගීමටද ඔවුන් යොදගෙන තිබේ. තවත් අවස්ථාවලදී වයස අවුරුදු 10 ද නොඉක්මවු අවු 2-4 ළමයින්ට විධිමත් අධ්‍යාපනයක් දෙන අතරතුර එල්.ටී.ටී.ඊ සංකල්පයද ඉගැන්වු අවස්ථා වාර්තා වී ඇත. බලෙන් බඳවා ගත් වයස 13 පමණ වන ළමයින් සමහර විට එල්.ටී.ටී.ඊ ළමා හමුදාවට බඳවාගෙන ඔවුන්ට ශාරීරික අභ්‍යාස සහ සටන් ක්‍රමද පුහුණු කර තිබේ. එල්.ටී.ටී.ඊ ය, පවසන්නේ ශාරීරික වර්ධනය අපේක්ෂාවෙන් එසේ පුහුණු කරන බවය. එහෙත් ඔවුන් කරන්නේ යුද මෙහෙවර සඳහා මුලික පුහුණුවකි. එවැනි ළමයින් බොහෝ දෙනා කඳවුරු වලින් පැනවිත් හමුදාවට හෝ ආගමික නායකයින් වෙත භාර වී ඇත. එසේ එම ළමයින් පැවසුයේ ඔවුන් එල්.ටී.ටී.ඊ යුධ පුහුණු කඳවුරු වලින් බේරී පලා ආ බවයි.

**ඊ. පිළිගත හැකි සේවා කොන්දේසි**

ජාතික මට්ටමේ අවම වැටුප් නියමයක් නැති අතර, කම්කරු දෙපාර්තමේන්තුව පත්කළ වැටුප් මණ්ඩල 40ක් පමණ ක්‍රියාත්මකව ඇත. අවම වැටුප් හා සේවා කොන්දේසි නියම කරනුයේ ඔවුන්ය. එම වැටුප් ප්‍රමාණයන් යහපත් ජීවන රටාවකට ප්‍රමාණවත් නොවේ. එහෙත් බොහෝ පවුල්වල සේවක සංඛ්‍යාව එක් අයකුට වඩා වැඩිය. කම්කරු දෙපාර්තමේන්තුව අවම වැටුප් නියම කරන්නේ මහා පරිමාණයේ සමාගම් වලටය. කුඩා පරිමාණයේ ස්ථාන දැඩි අවධානයට ලක් වන්නේ නැත. ඇඟලුම් කර්මාන්තයේ මාසික අවම වැටුප (ඩොලර් 27) රු. 2800/- කි. හෝටල් කර්මාන්තයේ මාසික අවම වැටුප (ඩොලර් 20) රු. 2100/- කි.

2002 ජුලි මාසයේදී වතු පාලන සමාගම් යටතේ ඇති තේ වතු වල සේවකයන්ගේ දෛනික වැටුප (සාමූහික එකඟතාවයේ නිරතවූ) රු. 121/- (ඩොලර් 1.24) සිට රු. 147/- (ඩොලර් 1.51) දක්වා වැඩි කෙරිණි. රබර් අංශයේ දෛනික වැටුප රු. 112/- (ඩොලර් 1.15) සිට රු. 131/- (ඩොලර් 1.35) දක්වා වැඩි කෙරණි.

සතියකට පැය 45 ඉක්මවන (සතියකට දින 5 1/2) සේ, පූර්ණකාලීන සේවකයකු වැඩ කිරීමට සැලැස්වීම නීතියෙන් තහනම්ය. මෑතදී හඳුන්වා දුන් නීතිය අනුව අතිකාල සේවාව මසකට පැය 60 සිට පැය 100 වන සේ සංශෝධනය කර තිබේ. එහෙත් සේවක කැමැත්ත අනුව අතිකාල සේවාවේ යෙදීම පිළිබඳ නව නීතියේ කිසිදු සඳහනක් නැත.

ශ්‍රාමියකුට වාර්ෂික නිවාඩු දින 14 ක්ද, වෛද්‍ය නිවාඩු දින 14-21 ක්ද ලැබෙන අතර දේශීය ප්‍රසිද්ධ නිවාඩු දින 20 ක් පමණ බුක්ති විඳීමට අවකාශ ඇත. ස්ථිරව කඩින්කඩව සහ අර්ධකාලීනව සේවය කරන කාන්තාවන්ට ප්‍රසූත නිවාඩු ලැබේ. කාර්මික අංශයේ සේවකයන් සඳහා ආරක්‍ෂක හා සනීපාරක්‍ෂක නීති ඇතත් ඒවා ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් අධීක්ෂණ කණ්ඩායමක් කම්කරු අමාත්‍යාංශය සතුව නැත. ඒ අතර එම නීති ජාත්‍යන්තර මට්ටමට නොසෑහෙන ඒවාය. අන්තරායකාරී ස්ථානවල සේවය කිරීම ප්‍රතික්ෂේප කිරීමට සේවකයන්ට අයිතියක් ඇතත්, එවැනි තැන් කවරේද යනු නිශ්චය කිරීමට ඔවුන් බහුතරයක් අපොහොසත් වීමත්, එසේ ප්‍රතික්ෂේප කිරීමෙන් රැකියාව අහිමිවේය යන බියත් අභාග්‍ය සම්පන්නය.

**එෆ්. පුද්ගල වෙළඳාම**

පුද්ගල - වෙළඳාම සහ බලෙන් යම් යම් අය රැගෙන යාම නීතියෙන් තහනම් වුවද බලෙන් වැඩ ගැනීම හා ලිංගික අපයෝජනය සඳහා කාන්තාවන් හා ළමයින් යොදා ගැනීම දක්නට ඇත. කාන්තාවන් ගෘහ සේවය සඳහා මැදපෙරදිගට ගිය විට ඔවුන් ලිංගික අපචාර සඳහා යොදා ගනු ලැබේ. එසේම තායිලන්ත, රුසියන් හා චීන කාන්තාවන්ද ලිංගික අපචාර සඳහා ලංකාවට ගෙනවිත් ඇත. ඇතැම් විට දේශීය මට්ටමින්ද ළමයින් ගෘහස්ථ සේවයට මෙන්ම ලිංගික අපචාර සඳහාද ගෙනයනු ලැබේ. කාන්තා - වෙළඳාමට වසර 2-20 තෙක් සිරදඬුවමක් සහ දඩයක්ද නියම වන්නේය. උතුරු නැගෙනහිර පලාත් මායිම් අසල දේශීය මට්ටමේ ළමා වෙළඳාම මහත් ගැටළුවක් වී තිබේ.

කඳුකරයේ සහ වෙරලාසන්න නිවාඩු නිකේතන ආදියෙහි ලිංගික අපචාර සඳහා යොදාගනු ලබන පිරිමි ළමයින්ගේ සංඛ්‍යාව 6,000 ක් පමණ වේයයි රාජ්‍ය නොවන දේශීය සංවිධානයක් වාර්තා කරයි. එම ළමයින්

වයස අවුරුදු 8-15 අතර අයවලුන්ය. ඇතැම් ළමයින් මව්පියන් විසින්ම අපචාරය සඳහා පොළඹවනු ලබති. (5කොටස බලන්න) වයස 15-18 අතර 7000 ක පමණ පිරිමි සංඛ්‍යාවක් සිය කැමැත්තෙන්ම ලිංගික අපචාරයට මැදිවී සිටින බවද ඉහත කී සංවිධානය වාර්තා කර තිබිණි. මෙවැනි අපචාර වලට එරෙහිව ක්‍රියාකිරීමේ වැඩ පිළිවෙලක් ජාතික ළමා ආරක්‍ෂක සංවිධානයත්, ජාත්‍යන්තර කම්කරු සංවිධානයත් හවුලේ දියත් කිරීමට ගිවිසගෙන සිටී.

පොලිසියද එම කාර්‍යයට 2002 වසරේ සිට ස්වකීය ප්‍රකාශන මගින් සහයෝගය දී තිබේ. මෙම අපචාර පිළිබඳව දෙනු ලැබූ ප්‍රසිද්ධිය සහ නීතිය තදින් ක්‍රියාත්මක කිරීම, හේතුකොටගෙන විදේශිකයන් මෙරට කරන ළමා අපචාර සහ ඔවුන් අප රටට ඒ පිළිබඳව තිබුන අපකීර්තියද තරමක් අවම වි ඇත.

අපචාරයට ගොදුරු වන එවැනි ළමයින්ගේ සහ කාන්තාවන්ගේ පුනරුත්ථාපන කටයුතු සඳහා රජය කඳවුරු පිහිටුවා ඇති අතර ඔවුන්ට නිසි මග පෙන්වන අධ්‍යාපනයක්ද, එහිදී ලබාගත හැකිය. විදේශ රැකියා ඔවුන්ට සොයා දීම සඳහා රාජ්‍ය සංවිධානයන්ද උපකාරීව සිටිති.